4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාවය

## 4.1 සමස්ත නිරීක්ෂණ

2010 දී උද්ධමනය මැදි තනි ඉලක්කමක මට්ටමෙහි අඛණ්ඩව පැවතිණි. 2008 නොවැම්බර් මස සිට අඩු වෙමින් පැවති කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002=100) මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2010 පෙබරවාරි මාසයේ දී සියයට 3.1 ක පහළ අගයක් කරා ළඟා වී 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 5.9 දක්වා ක්‍රමයෙන් ඉහළ නැගිණි. ලක්ෂ්‍යමය උද්ධමනය, 2010 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 6.5 හි සිට ජූලි මාසයේ දී සියයට 4.3 දක්වා පහළ ගිය නමුත් ඉන් පසු ඉහළ නැගීමේ නැඹුරුවක් අනුගමනය කරමින් 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 6.9 දක්වා ක්‍රමිකව ඉහළ නැගිණි. දේශීය සැපයුම් තත්ත්වයන්හි වර්ධනය සහ ආනයන බදු ගැලපුම් හා පරිපාලිත මිල ගණන් අඩු වන පරිදි කළ සංශෝධන උපයෝගී කොටගත් අනුග්‍රහශීලී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මෙන්ම විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය, වසර තුළ දී උද්ධමනය සාපේක්ෂව පහළ සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, සාපේක්ෂ වශයෙන් ස්ථාවර විනිමය අනුපාතිකය සහ ඵලදායිතාවය වැඩිදියුණු වීම ද වසර තුළ මිල පීඩනය පහත හෙලීමට උපකාරී විය. මේ අතර, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙන් ආහාර සහ බලශක්ති අයිතමයන් ඉවත් කොට ගණනය කරනු ලබන මූලික උද්ධමනය, 2010 වසරේ දී වාර්ෂික සාමාන්‍ය සහ ලක්ෂ්‍යමය යන දෙයාකාරයේම පදනම් මත, අඩුවන මාවතක ගමන් කළේය.

2010 වර්ෂයේ දී රජයේ හා පෞද්ගලික යන දෙඅංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ නැගුණු අතර, විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් සැලකිය යුතු ලෙස වැඩිවිය. 2010 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ සේවක වැටුප් ඉහළ නැංවීමක් සිදු නොවිණි. මුළුමනින්ම, 2009 නොවැම්බර් මස සිදු කළ ජීවන වියදම් දීමනා ගැලපුම හේතු කොට ගෙන, 2009 වර්ෂය සමඟ සසඳන විට 2010 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ සේවකයන් වැඩි නාමික වැටුපක් භුක්ති විඳින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2010 වර්ෂයේ දී මධ්‍යම රජයේ සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 3.3 කින් ඉහළ නැගිණි. 2009 වර්ෂයේ දී අත්විඳි සැලකිය යුතු මූර්ත වැටුප් වැඩිවීමට ප්‍රතිවිරුද්ධව යමින් 2010 වසරේ දී රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල සුළු පහළ යෑමක් සිදු විය. විධිමත් පෞද්ගලික අංශය සඳහා වූ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වර්ෂයට වඩා සියයට 32.0 කින්

ඉහළ නංවමින් 2010 දී, කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා වාණිජ සහ සේවා නමැති පඩි පාලක සභා මගින් පාලනය කෙරෙන විධිමත් පෞද්ගලික අංශයේ ප්‍රධාන කාණ්ඩ 3 හිම අවම වැටුප වැඩි විය. 2010 ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් සැලකිය යුතු ලෙස ඉහළ දැමීම මෙම තියුණු වැඩිවීමට මුල් විය. 2010 දී විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් විසින් මූර්ත වැටුප් වැඩිවීම් අත්විඳින ලදී. අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික සහ මූර්ත යන දෙයාකාරයේම වැටුප් 2010 දී ඉහළ නැගිණි.

**ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් 2009 වර්ෂයේ දී තාවකාලික පසුබැසීමක් වාර්තා කළ ද, වර්ෂ කිහිපයක් මුළුල්ලේ අඩු වෙමින් පැවති සේවා වියුක්ති අනුපාතිකය 2009 දී පැවති සියයට 5.8 හි සිට 2010 දී සියයට 4.9 දක්වා තවදුරටත් අඩු විය.** මෙය, වර්ධනය වෙමින් පැවති ආර්ථික ක්‍රියාවන් සහ ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ආර්ථිකයේ නැවත ඇති වූ පිබිදීම පෙන්නුම් කරන්නකි. මේ අතර, මුළු සේවා නියුක්තියට සේවා සහ කෘෂිකාර්මික අංශවල දායකත්වය වැඩි වීමත්, කර්මාන්ත අංශයේ දායකත්වය අඩු වීමත් සමඟ ප්‍රධාන ක්‍රියාකාරකම් අනුව සේවා නියුක්ති සංයුතියෙහි වෙනසක් සිදු විය. පසුගිය වසර කිහිපය පුරා සමස්ත ආර්ථික වර්ධනය උදෙසා විශාලතම දායකත්වය සැපයූ සේවා අංශය වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කරමින් 2010 දී ද ප්‍රමුඛතාවය දැරීය. මේ අතර, වර්ෂය තුළ දී සේවායෝජක සංඛ්‍යාව සහ ස්වයං රැකියාවල නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව වර්ධනය විය. කෙසේ වුව ද, 2009 වර්ෂය සමඟ සසඳන විට රාජ්‍ය අංශයේ සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන් සහ වැටුප් නොලබන පවුලේ සාමාජික සංඛ්‍යාවේ අඩු වීමක් දක්නට ලැබිණි. විවිධ යටිතල පසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ජීවනෝපාය ක්‍රියාකාරකම් ඉහළ මට්ටමකට ළඟා වීම හා ස්වයං රැකියා අවස්ථා බිහි වීම සහ සේවා අංශයෙහි විශේෂයෙන්ම, සාමය උදා වීමත් සමඟ සංචාරක කර්මාන්තයෙහි ක්‍රියාකාරකම් වැඩි වීමත් හේතු කොට ගෙන වඩා වැඩි රැකියා අවස්ථාවන් බිහි විය. මේ අතර, පසුගිය වසර කිහිපය පුරා දැකිය හැකි වූ ශ්‍රම ඵලදායිතාවයෙහි වැඩි දියුණු වීම 2010 වර්ෂයේ දී ද අඛණ්ඩව පැවතිණි. ඒ සමඟම, රටෙහි විදේශ විනිමය ඉපැයුම්වල ප්‍රධාන මූලාශ්‍රයක් වන විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව ද 2010 වසරේ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය.

## 4.2 මිල


### මිල විචලනයන් සහ දායක වූ සාධක

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

**අප රටෙහි නිල පාරිභෝගික මිල දර්ශකය වන කො.පා.මි. දර්ශකය 2010 වර්ෂාවසානයේ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 5.9 ක වැඩි වීමක් ද ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.9 ක වැඩි වීමක් ද වාර්තා කළේය.** වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 2010 ජනවාරි මාසයේ දී පැවති සියයට 3.1 ක පහළ මට්ටමක සිට වර්ෂය අවසානයේ දී සියයට 5.9 දක්වා ක්‍රමයෙන් ඉහළ නැගිණි. සමස්තයක් ලෙස, 2009 දෙසැම්බර් මස 213.5 ක්ව පැවති දර්ශකය 2010 දෙසැම්බර් මස දී 228.3 ක් දක්වා දර්ශකාංක 14.8 කින් ඉහළ නැගිණි. දර්ශකය 2010 ජනවාරි මස පැවති සියයට 6.5 හි සිට පෙබරවාරි මාසයේ දී සියයට 6.9 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගිය ද, ඉන්පසු නොකඩවා අඩු වෙමින් ජූලි මාසයේ දී සියයට 4.3 දක්වා ළඟා වූ අතර, එතැන් පටන් ක්‍රමයෙන් ඉහළ නගිමින් 2010 දෙසැම්බර් මස දී සියයට 6.9 තෙක් ළඟා විය.

**වසර තුළ උද්ධමනය කෙරෙහි දේශීය නිෂ්පාදිත භාණ්ඩවල මිල ඉහළ යෑම් විශාල ලෙස බලපෑවේය.** 2010 වසරේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල දායකත්වය සියයට 85.2 ක් වූ අතර, ආනයනික භාණ්ඩවල දායකත්වය සියයට 14.8 ක් විය. ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය ද මීට සමාන නැඹුරුවක් අනුගමනය කරන ලදී. උද්ධමනය කෙරෙහි දේශීයව නිෂ්පාදිත භාණ්ඩයන්හි දායකත්වය කො.පා.මි. දර්ශකයෙහි තවදුරටත් ප්‍රමුඛ වුව ද, 2010 මාර්තු මස සිට එහි සාපේක්ෂ වැදගත්කම අඩු වෙමින් පවතී.

**4.1 රූප සටහන — කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2002 = 100)**



**4.1 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකයේ සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 (අ) | 2009 දෙසැ./ 2008 දෙසැ. | 2010 දෙසැ./ 2009 දෙසැ. (අ) | 2009/2008 | 2010/2009 (අ) |
| කො.පා.මි.ද. (2002=100) | 199.9 | 206.8 | 219.1 | 4.8 | 6.9 | 3.4 | 5.9 |
| තොග මිල දර්ශකය | 3,653.6 | 3,500.9 | 3,893.0 | 13.3 | 17.6 | -4.2 | 11.2 |
| ද.දේ.නි. අවධමනකය | 298.3 | 315.8 (ආ) | 338.8 | - | - | 5.9 | 7.3 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**උද්ධමනය සඳහා ප්‍රධාන දායකත්වය, කො.පා.මි. දර්ශකයෙහි ඉහළම බර තැබීම වන සියයට 46.7 ක් හිමි ආහාර හා මධ්‍යසාර නොවන පාන අයත් උප කාණ්ඩයෙන් ලැබිණි.** ආහාර උප කාණ්ඩයෙහි වාර්ෂික සාමාන්‍ය වෙනස, වර්ෂය ආරම්භයේ වූ සියයට 2.6 හි සිට 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 6.8 දක්වා අඛණ්ඩව ඉහළ නැගිණි. සමස්ත දර්ශකය තුළ ආහාර උප කාණ්ඩය දරන ප්‍රමුඛතාවය හේතුවෙන් සමස්ත උද්ධමනය, එම උප කාණ්ඩයට සමගාමීව විචලනය විය. වර්ෂය තුළ සමස්ත කො.පා.මි. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස කෙරෙහි ආහාර උප කාණ්ඩය සියයට 56.9 කින් දායක විය. 2010 වර්ෂාවසානයේ දී ආහාර උප කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය වෙනස සියයට 10.0 ක් විය. මත්ස්‍ය, එළවළු, පළතුරු, පාන්, සීනි, බිත්තර, මස් සහ මස් නිෂ්පාදන, පොල්, පොල් තෙල් සහ කුළු බඩු වැනි ප්‍රධාන අයිතමයන්ගේ මිල ගණන් ඉහළ යෑම ආහාර උප කාණ්ඩයෙහි ඉහළ නැගීමට හේතු විය.

**දේශීය සැපයුම් තත්ත්වයන්හි වර්ධනය මෙන්ම, 2010 දෙසැම්බර් මාසයේ දී සහල් මිල ඉහළ යෑම පාලනය කිරීමට රජය මගින් ගත් ක්‍රියාමාර්ගයන් සහල්වල සාමාන්‍ය මිල පහළ දැමීමට ඉවහල් විය.** ප්‍රධාන වශයෙන්ම, වෙළඳපොළෙහි පැවති අඩු සැපයුම හේතුවෙන් 2009 වර්ෂය සමඟ සැසඳීමේ දී 2010 වර්ෂය ආරම්භයේ සහල් මිල සාපේක්ෂව ඉහළ අගයක පැවතිණි. ඉන් අනතුරුව, විශේෂයෙන්ම, නැගෙනහිර පළාතෙන් මහ කන්නයේ සරු වී අස්වනු නෙළීම ආරම්භ වීමත් සමඟ සහල් මිල ක්‍රමයෙන් පහළ වැටිණි. කෙසේ වුව ද, තිරිඟු පිටි සහ පාන්වල ඉහළ මිල ගණන් මගින් ඇති කළ ආදේශන බලපෑම හේතුවෙන් සහල් සඳහා ඉල්ලුම ඉහළ යෑම, 2010 ඔක්තෝබර් මස සිට නැවතත් සහල් මිල වැඩි වීමට ආංශික වශයෙන් හේතු විය. එසේ වුව ද, රජය විසින් 2010 දෙසැම්බර් මස 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සහල් මත මිල සීමාවන් පැන වීම, එම මිල ඉහළ යෑම පාලනය කිරීමට උපකාරී විය. ඉහත සියලු වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, 2009 වසර සමග සසඳන විට, 2010 වර්ෂයේ දී සහල්වල සාමාන්‍ය මිල සියයට 4.5 කින් පහළ වැටිණි.

**අයහපත් කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් ලද සැපයුම අඩු වීම හේතුවෙන් 2010 වර්ෂාවසානය වනවිට බොහෝ එළවළු වර්ගවල සාමාන්‍ය මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** පොල් නිෂ්පාදනය තියුණු ලෙස අඩු වීම නිසා 2009 වර්ෂය සමග සසඳන විට 2010 වර්ෂයේ දී පොල් සහ පොල් තෙල්වල සාමාන්‍ය මිල පිළිවෙළින් සියයට 28.9 කින් සහ සියයට 24.0 කින් ඉහළ ගියේය. ලොකු ළූණු, රතු ළූණු සහ අර්තාපල්වල සාමාන්‍ය දේශීය මිල ද පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 4.3, සියයට 3.3 සහ සියයට 2.9 වශයෙන් වූ මධ්‍යස්ථ ප්‍රතිශතයන්ගෙන් ඉහළ ගියේය.

**ඉල්ලුම වැඩි වීම සහ සැපයුම උච්චාවචනය වීම විශාල වශයෙන් හේතු කොට ගෙන, පසුගිය වර්ෂය සමඟ සසඳන විට මත්ස්‍ය සහ මුහුදු ආහාරවල සාමාන්‍ය මිල සියයට 10.2 ක වැඩි වීමක් වාර්තා කරමින් ඉහළ මට්ටමක පැවතිණි.** 2009 වර්ෂයට සාපේක්ෂව 2010 තුළ දී මත්ස්‍ය නිෂ්පාදනය සාමාන්‍ය වශයෙන් සියයට 12.0 ක වර්ධනයක් වාර්තා කළ ද 2010 වර්ෂයේ දී බොහෝ මත්ස්‍ය වර්ගවල මිල ගණන් සියයට 0.9-18.9 ක පරාසයක ඉහළ යෑම් වාර්තා කළේය. මේ අතර, 2010 වර්ෂය තුළ දී කුකුළු මස් සහ බිත්තර මිල ද පිළිවෙළින් සියයට 13.8 කින් සහ 28.0 කින් ඉහළ ගියේය. කුකුළු මස් සඳහා මිල සීමාවන් පැවතිය ද එහි මිල උච්චාවචනය වෙමින් 2010 මැයි මාසයේ දී ඉහළම මට්ටමට ළඟා විය. නමුත් කුකුළු මස් මත පැනවූ ආනයන බද්ද අඩු කිරීමත් සමඟ වසර අවසානයේ දී එහි මිල පහත වැටීමක් වාර්තා විය.

**ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල ජාත්‍යන්තර මිල ඉහළ යෑමෙන් ඒවායේ දේශීය මිල මත ඇති වූ බලපෑම, ආනයන සඳහා අදාළ බදු අඩු කිරීම මගින් යම්තාක් දුරට අඩු විය.** බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික

**4.2 සංඛ්‍යා සටහන** **ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2002=100) හරිත% | මිල රු. | | | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික සාමාන්‍යය | | | 2008 දෙසැ. | 2009 දෙසැ. | 2010 දෙසැ. (අ) | වාර්ෂික සාමාන්‍යය | | ලක්ෂ්‍යමය | |
| | | | 2008 | 2009 | 2010 (අ) | | | | 2009/ 2008 | 2010/ 2009 (අ) | 2009දෙසැ./ 2008දෙසැ. | 2010දෙසැ./ 2009දෙසැ. (අ) |
| **දේශීය** | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 2.8 | 73.99 | 72.66 | 72.05 | 74.17 | 77.54 | 72.30 | -1.8 | -0.8 | 4.5 | -6.8 |
| රතු කැකුළු සහල් | ,, | 0.9 | 65.73 | 62.53 | 60.10 | 64.96 | 65.55 | 59.19 | -4.9 | -3.9 | 0.9 | -9.7 |
| සුදු කැකුළු සහල් | ,, | 0.6 | 63.55 | 61.74 | 54.33 | 64.02 | 63.19 | 57.93 | -2.8 | -12.0 | -1.3 | -8.3 |
| නාඩු සහල් | ,, | 0.5 | 65.16 | 63.53 | 60.81 | 66.95 | 67.88 | 60.95 | -2.5 | -4.3 | 1.4 | -10.2 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | එකක් | 5.4 | 29.56 | 26.01 | 33.64 | 24.85 | 29.64 | 47.18 | -12.0 | 29.3 | 19.3 | 59.2 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 1.1 | 486.48 | 523.43 | 599.67 | 521.02 | 523.33 | 639.43 | 7.6 | 14.6 | 0.4 | 22.2 |
| බෝංචි | ,, | 0.5 | 119.60 | 114.99 | 137.22 | 109.66 | 134.22 | 157.17 | -3.9 | 19.3 | 22.4 | 17.1 |
| වම්බටු | ,, | 0.2 | 86.05 | 76.25 | 87.12 | 93.13 | 103.70 | 105.75 | -11.4 | 14.3 | 11.3 | 2.0 |
| බිත්තර | එකක් | 0.4 | 9.33 | 10.75 | 13.60 | 10.53 | 15.19 | 16.53 | 15.2 | 26.5 | 44.3 | 8.8 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 1.1 | 63.03 | 81.97 | 93.74 | 64.45 | 88.50 | 99.61 | 30.0 | 14.4 | 37.3 | 12.6 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400ක් | 3.8 | 274.46 | 251.73 | 234.35 | 268.57 | 225.00 | 244.00 | -8.3 | -6.9 | -16.2 | 8.4 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.8 | 190.73 | 199.70 | 165.63 | 206.23 | 177.33 | 168.32 | 4.7 | -17.1 | -14.0 | -5.1 |
| තිරිඟු පිටි | ,, | 0.2 | 73.18 | 70.84 | 69.61 | 69.15 | 71.67 | 82.43 | -3.2 | -1.7 | 3.6 | 15.0 |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල 2010 ජනවාරි මාසයේ පැවති එ.ජ.ඩොලර් 77.79 හි සිට අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් 73.53 දක්වා ක්‍රමයෙන් අඩු වූ නමුදු, 2010 දෙසැම්බර් මස වන විට එ.ජ.ඩොලර් 90.37 දක්වා ශීඝ්‍රයෙන් ඉහළ නැගිණි. මේ අතර, 2010 නොවැම්බර් මස 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉන්ධන මත බදු සංශෝධන කිහිපයක් සිදු විය. ඒ අනුව, පෙට්‍රල් ආනයනය හෝ සැපයීම, එකතු කළ අගය මත බද්දෙන් (VAT) නිදහස් කැරිණි. තවද, පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ දී ලබා දුන් මුළු රේගු බදු සහනය පිළිවෙලින් ලීටරයට රුපියල් 20 (අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 15) සහ ලීටරයට රුපියල් 11 (අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 4) දක්වා අඩු කැරිණි. කෙසේ වුව ද, ඉන්ධන මත වූ මෙම තීරු බදු සංශෝධනවලට අනුරූපීව සිල්ලර මිල සංශෝධනයන් සිදු නො කැරුණු හෙයින් එමගින් කො.පා.මි. දර්ශකය මත සෘජු බලපෑමක් ඇති නොවිණි. එහෙයින්, වර්ෂය පුරා දේශීය වෙළඳපොළෙහි ඉන්ධන මිල ස්ථාවරව පැවතීම, සමස්ත පිරිවැය ව්‍යුහය පාලනය කිරීමටත්, එමගින් ආර්ථිකය තුළ විශාල ප්‍රමාණයකින් උද්ධමනය පාලනය කිරීමටත් ඉවහල් විය.

**ප්‍රධාන ආහාර අයිතමයන් සඳහා වර්ෂය තුළ සිදු කළ ආනයන බදු සංශෝධන ද කො.පා.මි. දර්ශකය මත බලපෑමක් ඇති කළේය.** 2009 දෙසැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තිරිඟු පිටි කිලෝ ග්‍රෑමයක් මත වූ ආනයන බද්ද රුපියල් 10 කින් සහ 2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කිරිපිටි කිලෝග්‍රෑමයක් මත ආනයන බද්ද රුපියල් 50 කින් අඩු කිරීම, 2010 දී ඒවායේ දේශීය මිල ගණන් පහත හෙලීමට මුල් විය. මේ අතර, 2010 අප්‍රේල් සහ ජුනි මාසවල දී තිරිඟු පිටි මත ආනයන බද්ද දෙවරක් ඉහළ නංවන ලදී. 2010 පෙබරවාරි 16 වැනි දින සිට කිරිපිටි ආනයනයේ දී නැවත අයකරගත හැකි මුළු බදු ප්‍රමාණය කිලෝග්‍රෑමයකට රුපියල් 100 හි සිට රුපියල් 50 දක්වා පහළ දැමුණු අතර, 2010 වර්ෂයේ මැද සිට කිරිපිටි ග්‍රෑම් 400 ක මිල රුපියල් 19 කින් ඉහළ නැංවිණි. ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ඉහළ යෑම සහ 2010 ජුනි 21 වැනි දින සිට ආනයන බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 4 කින් ඉහළ දැමීම හේතුවෙන් 2010 දී සාමාන්‍ය සීනි මිල සියයට 15.5 කින් විශාල ලෙස ඉහළ ගියේය. මෙලෙසම, පරිප්පු මත විශේෂිත භාණ්ඩ බද්ද (SCL) 2010 අගෝස්තු 10 වැනි දින සිට ඉහළ නැංවුව ද ජාත්‍යන්තර වෙළඳපොළේ මිල පහළ යෑම්වල ප්‍රතිඵලයක් ලෙස පරිප්පුවල දේශීය මිල සැලකිය යුතු ලෙස අඩු විය. ඉහත ජාත්‍යන්තර මිල වර්ධනයන් සහ බදු වෙනස්කම් හි ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස 2009 වසර හා සැසැඳීමේ දී පරිප්පු, කිරිපිටි සහ තිරිඟු පිටිවල දේශීය වෙළඳපොළෙහි සාමාන්‍ය මිල 2010 වසරේදී පිළිවෙළින් සියයට 17.4, සියයට 6.7 සහ සියයට 1.7 බැගින් අඩු විය. රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, බිත්තර, කුකුළු මස් සහ ආහාරයට ගන්නා තෙල් වර්ග මත වූ ආනයනික සහ අනෙකුත් බදු සඳහා

කළ සංශෝධන මගින් ද වර්ෂය තුළ කො.පා.මි. දර්ශකය මත බලපෑමක් ඇති විය. මෙයට අමතරව, රුපියල සුළු වශයෙන් අධිප්‍රමාණ වීමෙන් ආනයනික අයිතමයන්හි මිල මත හිතකර බලපෑමක් ඇති විය.

**දර්ශකයේ ඉහළ යෑම සඳහා නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන උප කාණ්ඩයන්ගෙන් සැලකිය යුතු දායකත්වයක් ලැබිණි.** 2010 වාර්ෂික සාමාන්‍ය වැඩි වීම කෙරෙහි එම උප කාණ්ඩ, පිළිවෙළින් සියයට 11.6, සියයට 11.3 සහ සියයට 9.1 බැගින් දායක විය. වර්ෂය තුළ එල්.පී. ගෑස් මිල ඉහළ දැමීම, නිවාස, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයේ ඉහළ යෑමට හේතු විය. 2010 දී එල්.පී. ගෑස්වල සාමාන්‍ය මිල සියයට 11.3 කින් වැඩි විය. සෞඛ්‍ය උප කාණ්ඩයේ ඉහළ යෑම කෙරෙහි පෞද්ගලික රෝහල් මගින් සපයනු ලබන සේවාවන්, ඖෂධ සහ විශේෂඥ වෛද්‍ය උපදේශන ගාස්තු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. අධ්‍යාපන උප කාණ්ඩයෙහි ඉහළ යෑමට උපකාරක පංති ගාස්තු වැඩි වීම හේතු විය. මේ අතර, රෙදිපිළි හා පාවහන්; ප්‍රවාහන; සන්නිවේදන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු; විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු; සහ විවිධ භාණ්ඩ හා සේවා යන අනෙකුත් සියලුම උප කාණ්ඩ, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි සියයට 0.9 හි සිට සියයට 2.8 ක පරාසයක දයකත්වයක් සැපයීය.

**කො.පා.මි. දර්ශකයෙහි ආහාර හා බලශක්ති අයිතමයන් හැර ගණනය කරනු ලබන මූලික උද්ධමනය වාර්ෂික සාමාන්‍ය පදනම මත, 2010 ජනවාරි මස පැවති සියයට 8.6 හි සිට දෙසැම්බර් මාසයේ දී සියයට 6.3 දක්වා ක්‍රමයෙන් පහත වැටිණි.** එමෙන්ම, ලක්ෂ්‍යමය

**4.3 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල සංශෝධන 2008 - 2010**

| අයිතමය | ඒකකය | | මිල (වසර අවසානයේ දී) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2008 | 2009 | 2010 | 2009/2008 | 2010/2009 |
| ඩීසල් | ලී. 1ක් | | 70.00 | 73.00 | 73.00 | 4.3 | 0.0 |
| භූමිතෙල් | ” | | 50.00 | 51.00 | 51.00 | 2.0 | 0.0 |
| පෙට්‍රල් | ” | | 120.00 | 115.00 | 115.00 | -4.2 | 0.0 |
| ගෑස් - ෂෙල්/ලිට්‍රෝ (අ) | කි.ග්‍රෑ. 12.5 | | 1,619.00 | 1,550.00 | 1,652.00 | -4.3 | 6.6 |
| ලාෆ් | කි.ග්‍රෑ. 12.5 | | 1,403.00 | 1,421.00 | 1,540.00 | 1.3 | 8.4 |
| ඇව්තෙල් (1000) | ලී. 1ක් | | 52.70 | 52.70 | 52.70 | 0.0 | 0.0 |
| ඇව්තෙල් (1500) | ” | | 31.70 | 32.70 | 32.70 | 3.2 | 0.0 |
| ඇව්තෙල් (3500) | ” | | 25.00 | 26.00 | 26.00 | 4.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ස්ථාවර ගාස්තු | ඒකක පරාසය | | | | | | |
| | | 0-30 | 60.00 | 60.00 | 60.00 | 0.0 | 0.0 |
| | | 31-60 | 90.00 | 90.00 | 90.00 | 0.0 | 0.0 |
| | | 61-90 | 120.00 | 120.00 | 120.00 | 0.0 | 0.0 |
| | | 91-180 | 180.00 | 180.00 | 180.00 | 0.0 | 0.0 |
| | | 180ට වැඩි | 240.00 | 240.00 | 240.00 | 0.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ඒකක ගාස්තු | ඒකක පරාසය | | | | | | |
| | | 0-30 | 3.00 | 3.00 | 3.00 | 0.0 | 0.0 |
| | | 31-60 | 4.70 | 4.70 | 4.70 | 0.0 | 0.0 |
| | | 61-90 | 7.50 | 7.50 | 7.50 | 0.0 | 0.0 |
| | | 91-180 | 16.00 | 16.00 | 16.00 | 0.0 | 0.0 |
| | | 180ට වැඩි | 25.00 | 25.00 | 25.00 | 0.0 | 0.0 |
| ජල ගාස්තු - ඒකක ගාස්තු | ඒකක පරාසය | 0-5 | 1.25 | 3.00 | 3.00 | 140.0 | 0.0 |
| | | 6-10 | 1.25 | 7.00 | 7.00 | 460.0 | 0.0 |
| | | 11-15 | 2.50 | 15.00 | 15.00 | 500.0 | 0.0 |
| | | 16-20 | 8.50 | 30.00 | 30.00 | 252.9 | 0.0 |
| | | 21-25 | 30.00 | 50.00 | 50.00 | 66.7 | 0.0 |
| | | 26-30 | 50.00 | 75.00 | 75.00 | 50.0 | 0.0 |
| බස් ගාස්තු | | | - | - | - | 5.3 | 0.0 |

(අ) 2010 සඳහා ලිට්‍රෝ සමාගමේ මිල ගණන් සඳහන් කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 9**

## අන්ත කාලගුණික තත්ත්වයන් සහ ඒවායේ බලපෑම්


2010 වර්ෂය අවසන් කොටසේ දී සහ 2011 මුල් කොටසේ දී ශ්‍රී ලංකාව ඇතුළු රටවල් ගණනාවක් ඉතා අයහපත් කාලගුණික තත්ත්වයන්ගෙන් දැඩි ලෙස පීඩාවට පත් විය. මෙම කාලය තුළ දී ශ්‍රී ලංකාව පුරා අසාමාන්‍ය ලෙසින් පැවැති අධික වර්ෂාපතනය නිසා හටගත් ගංවතුර සහ නායයාම්වලින් නිවාස, යටිතල පහසුකම් සහ බෝග වගාවන්ට තදබල හානි ඇති වූ අතර මිනිස් ජීවිත හානි ද වාර්තා විය. ඕස්ට්‍රේලියාව, බ්‍රසීලය සහ පිලිපීනය වැනි රටවලට ද වර්ෂාපතනයන්ගෙන් ඇති වූ හානිය ඉතාමත්ම බරපතල වූ අතර, ඒවා එම රටවල මහත් ව්‍යසනයන් ඇති කළ ස්වභාවික විපත් අතරට එක් විය. මෙම කාලයේ දී ම පැවැති "ලා නිනා" (La Niña) ලෙසින් හඳුන්වනු ලබන කාලගුණික තත්ත්වය ඉහත කී අසාමාන්‍ය කාලගුණික විපර්යාසයන් හා සබැඳියාවක් ඇති බව ඇතැම් විශේෂඥයන්ගේ අදහසයි.


ශාන්තිකර සාගරයේ මධ්‍යම සහ නැගෙනහිර ප්‍රදේශබඳ නිවර්තන කලාපයේ සාගර මතුපිට උෂ්ණත්වය එහි සාමාන්‍ය අගයන්ට වඩා පහළ බැසීම ලා නිනා තත්ත්වයක් ලෙස සාමාන්‍යයෙන් අර්ථකථනය කෙරේ. ශාන්තිකර සයුරු ප්‍රදේශවලට සාපේක්ෂව වඩාත් බටහිරට වන්නට පිහිටි ශ්‍රී ලංකාවට ලා නිනාහි බලපෑම් සාමාන්‍යයෙන් ඇති විය හැකි නොවේ. එසේ වුවත්, කාලගුණ රටාවන් කෙරෙහි එමගින් ඇති විය හැකි බලපෑම සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කොට ඇත්තේ ද නැත. ඒ, ලා නිනා මඟින් ජනිත වන ප්‍රබල සුළං ධාරා ශ්‍රී ලංකාවේ ඊසාන දිග මෝසම් තත්ත්වය තීව්‍ර කිරීමට තුඩු දිය හැකි බැවිනි.

2011 වර්ෂයේ ජනවාරි මාසයේ සහ පෙබරවාරි මස මුල් කාලය තුළ රටේ ප්‍රදේශ කිහිපයකින්ම අධික වර්ෂාපතනයන් වාර්තා වූ අතර නැගෙනහිර ප්‍රදේශය දැඩි ගංවතුර තත්ත්වයන්ගෙන් පීඩාවට පත් විය. එකී ප්‍රදේශවල වූ බොහොමයක් වැව් සහ ජලාශ පිටාර මට්ටම් දක්වා පිරී ගිය අතර වැව් බැමි කිහිපයක් බිඳිණි. තවත් අසාමාන්‍ය සංසිද්ධියක් වූයේ ජනවාරි මස තුළ රටෙහි පැවැති ඉතා අඩු උෂ්ණත්වයන්ය. මඩකලපුව සහ කුරුණෑගල වැනි ප්‍රදේශවල උෂ්ණත්ව අගයන් සෙල්සියස් අංශක 18 ටත් වඩා පහළ වැටිණි.

2011 ජනවාරි මස තුළ, නැගෙනහිර සහ උතුරු මැද පළාත් අධික වර්ෂාපතනයෙන් හටගත් ගංවතුරෙන් තදබල ලෙස පීඩා විඳි අතර රටෙහි කඳුකර පෙදෙස්හි දරුණු නායයාම් ඇති විය. මෙකී ස්වභාවික විපත්වලින් ජීවිත හානි වාර්තා වූ අතර ඉන් බොහොමයක් මඩකලපුව,

**රූප සටහන වි.ස. 9.1** **2011 මුල් සමය තුළ වර්ෂාපතනය, අවුරුදු 30 ක සාමාන්‍ය අගයන් සමඟ සැසඳීම**





මූලය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

අම්පාර සහ මහනුවර දිස්ත්‍රික්කවලින් වාර්තා විය.[1] 2011 පෙබරවාරි මස මුල් සතිය තුළ දී දෙවන වරටත් අධික වර්ෂාපතනයන් වාර්තා විය. නැගෙනහිර සහ උතුරුමැද පළාත්වලින් මිලියනයකටත් වඩා පිරිසක් පීඩාවට පත් වූ අතර මුළු රට පුරා පීඩාවට පත් වූ පිරිස මිලියන 1.2 ඉක්ම විය. 2011 පෙබරවාරි මස 9 වැනි දින පළ වූ වාර්තාවලට අනුව නිවාස 3,700 ට වඩා සම්පූර්ණයෙන් හානියට පත් වූ අතර යම් යම් කොටස් හානි වූ නිවාස සංඛ්‍යාව 23,000 ට වඩා වැඩි විය. ජීවිත හානි වලට අමතරව 140,000 ට වඩා ජනතාව අවතැන් විය.

[1] 2011 ජනවාරි 23 දින පළ වූ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තත්ත්ව වාර්තාවට අනුව.

**රූප සටහන වි.ස.9.2**

**2011 මුල් සමයේ දී මඩකලපුවෙන් වාර්තා වූ අඩු උෂ්ණත්වය 1901 සිට වාර්තා වූ අවම උෂ්ණත්ව අගයන් හතර සමග සැසඳීම**




මූලය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

බෝග වගාවන්ට හා වගා බිම්වලට මෙම ස්වභාවික විපතෙන් සැලකිය යුතු ආර්ථික හානියක් සිදු වූ අතර එම හානි පිරිමසා ගැනීමට විශාල මුදලක් අවශ්‍ය වේ. එසේම, හානියට පත් වූ යටිතල පහසුකම් යළි නගා සිටුවීමට ද විශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය විය. පීඩාවට පත් වූ ජනතාවට සහන සැලසීමට සහ ජනතාවගේ සාමාන්‍ය ජීවන තත්ත්වයන් යළි ස්ථාපනය කිරීම සඳහා සිදු කළ කඩිනම් පුනරුත්ථාපන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් රජය විසින් පැවැති අයවැය සම්පත්වලින් සැපයීය. රජය මැදිහත්ව සිදු කළ හදිසි සහන සහ පුනරුත්ථාපන වැඩසටහන් අතිශය සාර්ථක විය. පීඩාවට පත් වූ පවුල් සඳහා අවශ්‍ය ආහාර පාන, ඉඳුම්-හිටුම් සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීමේ කටයුතු මෙහිදී විශේෂයෙන් කැපී පෙනිණි.

අම්පාර, පොළොන්නරුව, අනුරාධපුර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල වී වගාවට ගංවතුරෙන් දැඩි හානි සිදු විය. ගංවතුරෙන් සිදු වූ හානියට අමතරව මෙම කාලයේ දී රට පුරා පැවැති ශීත කාලගුණය ද වී අස්වැන්නෙහි ගුණාත්මක බව අඩු වීමට හේතු විය හැකි අතර, මේ නිසා 2010/11 මහ කන්නයේ අස්වැන්න අඩු වනු ඇත. අනෙකුත් අතිරේක ආහාර බෝගයන්ට ද හානි සිදු විය. අස්වනු පහත වැටීම, ආහාර තොග විනාශ වීම සහ ප්‍රවාහන අපහසුතා ආහාර මිල, විශේෂයෙන් එළවළු මිල කෙරෙහි බලපාන ලදී. බොහෝ රටවලට බල පෑ අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ලෝක ආහාර සැපයුම පහළ බැසීම හා ඒ සමගින් මිල ඉහළ නැගීම යන පසුබිම හමුවේ ආහාර ද්‍රව්‍යවල සිදුවිය හැකි සැපයුමේ අඩුවීමත් මිල ඉහළ නැගීමත් කලමනාකරණය කරමින් මිල ස්ථායිතාව රඳවා ගැනීම අභියෝගාත්මක කාර්යයෙකි.

හානියට පත් වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීමට රජය කඩිනමින් ක්‍රියා කළ අතර යෝජිත පුනරුත්ථාපන වැඩසටහන සඳහා රුපියල් බිලියන 33 ක් වෙන් කිරීමට තීරණය කැරිණි. තව ද, 2011 වර්ෂය සඳහා පරිපූරක අයවැය ඇස්තමේන්තු අත්හිටුවීමටත්, රේඛීය අමාත්‍යාංශ සහ ආයතන යටතේ ඇති වැඩසටහන් පුනරුත්ථාපන වැඩසටහන හා බද්ධ කොට ගැනීමටත්, ගෙවතු වගා දශලක්ෂය ඇතුළු ආහාර නිෂ්පාදන මෙහෙවර කඩිනම් කිරීමටත්, වගාවන් සඳහා නොමිලේ බීජ ලබා දීමටත්, එළවළු සහ වෙනත් සියලුම බෝග වගාවන් සඳහා පොහොර සහනාධාරය ලබා දීමටත් තීරණය කැරිණි. මීට අමතරව, පුනරුත්ථාපන කටයුතු සඳහා මනා ලෙස සම්බන්ධීකරණය වූ වඩා ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම හා ඒවා අධීක්ෂණය කිරීම සඳහා කාර්යසාධන බලකායක් ද පත් කරන ලදී.

2010 වර්ෂය අවසන් කොටසේදී සහ 2011 මුල් කොටසේදී හටගත් ඉතා අයහපත් වූ කාලගුණ තත්ත්වයන්ගේ පීඩාකාරී බලපෑම්වලින් රජයට අමතර වගකීම් පැවරිණි. මෙය, රාජ්‍ය මූල්‍ය අංශයේ සහ සාර්ව ආර්ථික ක්ෂේත්‍රයේ මෑත කාලීනව රජය අත්කරගත් ජයග්‍රහණ තවදුරටත් ශක්තිමත් කර ගැනීමේ දී රජය ඉදිරියේ ඇති නව අභියෝගයකි. මෙම අභියෝගවලට මුහුණ දීමේ සාර්ථකත්වය රටේ ආර්ථිකය ක්ෂණිකව යළි නගා සිටුවීමට ඇති හැකියාව පිළිබිඹු කරනු ඇත.

මූලාශ්‍ර:


www.disasmin.gov.lk; Ministry of Disaster Management, Sri Lanka.

www.dmc.gov.lk; Disaster Management Centre, Ministry of Disaster Management, Sri Lanka.

www.noaa.org; National Oceanic and Atmospheric Administration.

පදනම මත මූලික උද්ධමනය ද 2010 ජනවාරි මස පැවති සියයට 7.9 සිට 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 5.6 දක්වා පහත වැටිණි. 2010 වසර තුළ දී, උපකාරක පංති ගාස්තු සහ ඖෂධ හා විශේෂඥ වෛද්‍ය උපදේශන ගාස්තු ඇතුළත් පෞද්ගලික වෛද්‍ය සේවා ගාස්තුවල ඉහළ යෑම හේතුවෙන් අධ්‍යාපන සහ සෞඛ්‍ය යන උප කාණ්ඩවල මිල ඉහළ යෑම, ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි දායක විය.

**ආදායම් තත්ත්වයේ වැඩිදියුණු වීම සහ පාරිභෝගික රුචිකත්වයෙහි හා කැමැත්තෙහි වෙනස් වීම් හේතු කොට ගෙන ගෘහස්ථ පරිභෝජන රටාවේ සිදු වූ වෙනස් වීම් පිළිබිඹු වන පරිදි කො.පා.මි. දර්ශකයෙහි පදනම් වර්ෂය 2002 සිට 2006/07 දක්වා, 2011 වර්ෂයේ දී සංශෝධනය කිරීමට බලාපොරොත්තු වේ.** 2006/07 කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කර ගනිමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි. දර්ශකයෙහි සංශෝධනයන් සම්බන්ධ වැඩකටයුතු සම්පූර්ණ කරන ලදී. 2011 මැද වනවිට 2002 වර්ෂය පදනම් කරගත් කො.පා.මි. දර්ශකය වෙනුවට නව වර්ෂය පදනම් කරගත් කො.පා.මි. දර්ශකය ආදේශ කිරීමට බලාපොරොත්තු වේ.

### තොග මිල දර්ශකය (තො.මි.ද.)

**තො.මි. දර්ශකය මගින් මනිනු ලබන ප්‍රාථමික වෙළඳපොළ මට්ටමේ උද්ධමනය වසරේ මුල් මාස 9 තුළ දී ලක්ෂ්‍යමය පදනම මත පහත බැසීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, 2010 සැප්තැම්බර් මාසයේ දී එය 5.2 දක්වා ළඟා විය.** කෙසේ නමුත්, ඉන් පසුව එම ප්‍රවණතාවය ප්‍රතිවිරුද්ධ අතට ගමන් කරමින් වසර අවසානයේ දී සියයට 17.6 ක් දක්වා තියුණු ලෙස ඉහළ යෑමක් වාර්තා කළේය.

**වාර්ෂික සාමාන්‍ය පදනම මත තො.මි. දර්ශකය 2010 ජනවාරි මස පැවති සියයට 2.5 ක සෘණාත්මක අගයක සිට 2010 දෙසැම්බර් වනවිට සියයට 11.2 දක්වා වසර තුළ දී අඛණ්ඩව ඉහළ යෑමේ මාවතක ගමන් කෙරිණි.** ආහාර කාණ්ඩය සඳහා වූ උප දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩි වීම සියයට 10.1 ක් විය. 2010 වසරේ දී රෙදිපිළි හා පාවහන්, රසායනික ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදන, ලෝහ නිෂ්පාදන සහ විදුලි උපාංග යන උප දර්ශක පිළිවෙළින් සියයට 2.4, සියයට 13.6, සියයට 1.1 සහ සියයට 0.4 ලෙස වාර්ෂික සාමාන්‍ය පදනම මත පහත වැටිණි. කො.පා.මි. දර්ශකයෙහි අංශ අනුව කරන ලද වර්ගීකරණයට අනුව දේශීය හා අපනයන කාණ්ඩයන්හි මිල ගණන් වර්ෂය තුළ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත පිළිවෙළින් සියයට 3.0 සහ සියයට 28.7 ලෙස වැඩි වූ අතර, ආනයනික කාණ්ඩයේ මිල ගණන් සියයට 0.9 කින් පහත වැටිණි. අපනයන කාණ්ඩයේ ඉහළ යාම සඳහා කොකෝවා, රබර් නිෂ්පාදන, කරදමුංගු, පොල්, පොල් තෙල්, කුරුඳු සහ තේවල මිල ගණන් ඉහළ යෑම හේතු විය. තොග මිල දර්ශකයේ අවසන් භාවිත වර්ගීකරණයට අනුව, කාණ්ඩ තුනෙහිම එනම් පාරිභෝගික, අතර මැදි සහ ආයෝජන යන කාණ්ඩයන්හි මිල ගණන් වාර්ෂික සාමාන්‍ය පදනම මත පිළිවෙළින් සියයට 9.9, සියයට 17.7 සහ සියයට 0.9 ලෙස වර්ෂය අවසානයේ දී ඉහළ ගියේය. මෙම කාණ්ඩයන් අතුරින් මුං ඇට, පොල්, පොල් තෙල්, බිත්තර, සීනි, පළතුරු සහ එළවළු මිල ඉහළ යාම පාරිභෝගික කාණ්ඩයේ ඉහළ යාම සඳහා විශාල ලෙස දායක වූ අතර, කොකෝවා, රබර්, කරදමුංගු සහ කුරුඳු මිල ඉහළ යාම අතරමැදි කාණ්ඩයේ ඉහළ යාම සඳහා දායක විය.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මගින් ගණනය කරනු ලබන ආර්ථිකයේ සමස්ත මිල වෙනස් වීම 2009 වසරේ පැවති සියයට 5.9 හා සැසඳීමේ දී 2010 වසරේ දී සියයට 7.3 ක් ලෙස ඉහළ යාමක් පෙන්නුම් කෙරිණි.** පසුගිය වසර හා සැසඳීමේ දී කෘෂිකර්මාන්ත හා සේවා යන දෙ අංශයෙහිම පිළිවෙළින් සියයට 9.2 ක් හා සියයට 7.5 ක් ලෙස ඉහළ උද්ධමන අනුපාතික වාර්තා විය. 2009 වසරේ දී කෘෂිකාර්මික අංශයේ උද්ධමනයෙහි වාර්තා වූ සෘණාත්මක වර්ධනය හා සැසඳීමේ දී 2010 වසරේ මෙම අංශයේ උද්ධමනයෙහි සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. වසර තුළ දී සියයට 6.0 ක් වූ අඩුතම උද්ධමන අනුපාතිකය කර්මාන්ත අංශයෙන් වාර්තා වූ අතර, එය 2009 දී පැවති සියයට 6.3 සිට සුළු අඩු වීමකි.

## 4.3 වැටුප්

**රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයෙහිම නාමික වැටුප් 2010 වර්ෂයේ දී වැඩි විය.** පෞද්ගලික අංශයේ විධිමත් හා අවිධිමත් යන දෙ අංශයෙහිම සේවකයන්, නාමික වැටුප්වල මෙන්ම මූර්ත වැටුපෙහි ද වැඩි වීමක් භුක්ති විඳින ලද අතර, මෙම වැඩි වීම පඩි පාලක සභා මගින් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සම්බන්ධයෙන් ඉතා ඉහළ අගයක් ගැනිණි. 2010 වර්ෂය තුළ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ඉහළ නැංවීමක් සිදු නොකළ ද, 2009 වසරේ නොවැම්බර්

**4.4 සංඛ්‍යා සටහන**

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 (අ) | 2010(ආ) | 2009/08 (අ) | 2010/09 (ආ) |
| කෘෂිකාර්මික | 342.2 | 344.8 | 376.5 | 0.8 | 9.2 |
| කාර්මික | 304.0 | 323.0 | 342.4 | 6.3 | 6.0 |
| සේවා | 285.1 | 304.7 | 327.6 | 6.9 | 7.5 |
| **ද.දේ.නි.** | **298.3** | **315.8** | **338.8** | **5.9** | **7.3** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මාසයේ දී සිදු කළ ජීවන වියදම් දීමනා ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්හි වාර්ෂික සාමාන්‍යය 2010 වර්ෂයේ දී සියයට 3.3 කින් වැඩි විය. 2010 වර්ෂය තුළ දී මිල මට්ටමවල ඉහළ යාම සමනය කිරීමට ප්‍රමාණවත් අයුරින් නාමික වැටුප් වැඩි නොවීම හේතුවෙන් රාජ්‍ය අංශයේ සියලුම කාණ්ඩයන්හි සේවකයන්ගේ මූර්ත වැටුප් දර්ශකයන්හි පහත වැටීමක් 2010 වසරේ දී නිරීක්ෂණය කෙරිණි.

### රාජ්‍ය අංශයේ වැටුප්

**2010 වසරේ දී, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් දර්ශක සාපේක්ෂව සුළු වැඩි වීමක් වාර්තා කළේය.** රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ සන්නද්ධ හමුදාවල සේවකයින් සඳහා ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව අවසන් වරට රුපියල් 750 කින් වැඩි කරන ලද්දේ 2009 නොවැම්බර් මාසයේ දීය. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව රුපියල් 5,250 ක් ලෙස 2010 වසර තුළ දී ද නොවෙනස්ව පැවතුණි. 2009 නොවැම්බර් මාසයේ සිදු වූ ජීවන වියදම් දීමනාවේ ඉහළ යෑම හේතුවෙන්, මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය, 2009 වසරේ සියයට 9.4 ක වැඩි වීම හා සැසඳීමේ දී 2010 වසරේ දී සියයට 3.3 කින් වැඩි විය. 2009 වර්ෂයේ දී සියයට 8.9-10.0 පරාසයක සිදු වූ වැඩි වීම හා සැසඳීමේ දී විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් හා රජයේ පාසැල්වල ගුරුවරුන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින් සියයට 3.1, සියයට 3.5 සහ සියයට 3.3 ලෙස ඉහළ ගියේය.

**නාමික වැටුප්, උද්ධමනය සමඟ ගැලපූ විට, 2009 වසරේ දී සැලකිය යුතු මූර්ත වැටුප් වර්ධනයන් භුක්ති විඳිනු ලැබුව ද, 2010 වසරේ දී රාජ්‍ය අංශයේ සියලුම සේවක කාණ්ඩයන්හි මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල සුළු පහත වැටීමක් සිදු විය.** ඒ අනුව, විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් සහ රජයේ පාසැල් ගුරුවරුන් විසින් 2009 වර්ෂයේ දී භුක්තිවිඳින ලද සියයට 5.2-6.3 පරාසයක මූර්ත වැටුප් වැඩි වීම හා සැසඳීමේ දී 2010 වර්ෂය තුළදී පිළිවෙළින් සියයට 2.6, සියයට 2.3 සහ සියයට 2.5 කින් ඔවුන්ගේ මූර්ත වැටුප් පහළ වැටිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මධ්‍යම රජයේ සෙවකයන්ගේ සමස්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි පූර්ව වර්ෂයට වඩා සියයට 2.5 කින් පහත වැටීමක් වාර්තා විය.

### විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මනිනු ලබන සංවිධිත පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2010 වර්ෂය තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ නැගිණි.**

**4.5 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

(1978 දෙසැම්බර් = 100)

| සේවක කාණ්ඩ | දර්ශකය - නාමික 2008 | දර්ශකය - නාමික 2009 | දර්ශකය - නාමික 2010(ආ) | දර්ශකය - මූර්ත (අ) 2008 | දර්ශකය - මූර්ත (අ) 2009 | දර්ශකය - මූර්ත (අ) 2010(ආ) | ප්‍රතිශත වෙනස - නාමික 2008 | ප්‍රතිශත වෙනස - නාමික 2009 | ප්‍රතිශත වෙනස - නාමික 2010(ආ) | ප්‍රතිශත වෙනස - මූර්ත (අ) 2008 | ප්‍රතිශත වෙනස - මූර්ත (අ) 2009 | ප්‍රතිශත වෙනස - මූර්ත (අ) 2010(ආ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| මධ්‍යම රජයේ සේවකයන් | **4,116.1** | **4,502.8** | **4,651.6** | **150.4** | **159.0** | **155.1** | **7.5** | **9.4** | **3.3** | **-12.4** | **5.7** | **-2.5** |
| විධායක නොවන | 3,749.5 | 4,082.4 | 4,210.4 | 137.0 | 144.2 | 140.4 | 7.3 | 8.9 | 3.1 | -12.5 | 5.2 | -2.6 |
| සුළු සේවකයන් | 4,494.7 | 4,943.5 | 5,116.1 | 164.2 | 174.6 | 170.6 | 7.7 | 10.0 | 3.5 | -12.2 | 6.3 | -2.3 |
| රජයේ පාසල් ගුරුවරුන් | 2,938.6 | 3,215.3 | 3,321.7 | 107.4 | 113.5 | 110.7 | 7.2 | 9.4 | 3.3 | -12.5 | 5.7 | -2.5 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | **2,070.4** | **2,171.4** | **2,865.3** | **75.5** | **76.7** | **95.5** | **25.6** | **4.9** | **32.0** | **2.7** | **1.5** | **24.5** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 2,286.6 | 2,349.4 | 3,327.6 | 83.5 | 83.0 | 110.9 | 25.5 | 2.7 | 41.6 | 2.6 | -0.6 | 33.7 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 1,877.5 | 2,054.0 | 2,198.9 | 68.5 | 72.5 | 73.2 | 23.3 | 9.4 | 7.1 | 0.9 | 5.9 | 0.9 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 1,370.8 | 1,545.8 | 1,673.3 | 49.9 | 54.6 | 55.7 | 29.7 | 12.8 | 8.2 | 6.0 | 9.3 | 2.0 |

(අ) මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක කො.පා.මි.ද. (2002=100) පදනම් කොට ගෙන ගැලපුම් කර ඇත.
(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

විධිමත් පෞද්ගලික අංශයේ ප්‍රධාන අංශ තුනෙහි, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශවල අවම වැටුප් ප්‍රමාණ දර්ශක 2010 වසරේ දී පිළිවෙළින් සියයට 41.6, සියයට 7.1 සහ සියයට 8.2 ලෙස වැඩි විය. 2010 ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 41.3 කින් ඉහළ දැමීම, මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2010 ජූලි මාසයේ දී කෘෂිකාර්මික අංශයේ (සියයට 0.5 කින්), 2010 අගෝස්තු මාසයේ දී කර්මාන්ත හා වාණිජ අංශයේ (සියයට 16.9 කින්) සහ සේවා අංශයේ (සියයට 19.8 කින්) නාමික වැටුප් ප්‍රමාණ දර්ශක ඉහළ නැගිණි. ඉහත වැඩිකිරීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස සංවිධිත පෞද්ගලික අංශයේ සමස්ත වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි පසුගිය වර්ෂයට වඩා සියයට 32.0 ක වැඩිවීමක් වාර්තා විය.

**නාමික වැටුප් ප්‍රමාණ දර්ශකවල වැඩි වීම උද්ධමනය සමඟ ගැලපූ විට, විධිමත් පෞද්ගලික අංශයේ සියලුම ප්‍රධාන කාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප්වල වැඩි වීමක් 2010 වර්ෂය තුළ දී අත්විඳින ලද අතර, විශේෂයෙන්ම, කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය.** ඒ අනුව, කෘෂිකර්මාන්ත අංශයේ, කර්මාන්ත හා වාණිජ අංශයේ සහ සේවා අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයන්හි මූර්ත අගය පිළිවෙළින් සියයට 33.7, සියයට 0.9 සහ සියයට 2.0 වූ ප්‍රතිශතයන්ගෙන් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පඩිපාලක සභා මගින් පාලනය වන සේවකයන් සඳහා වන සමස්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය පසුගිය වර්ෂයේ සියයට 1.5 ට සාපේක්ෂව 2010 වර්ෂයේ දී සියයට 24.5 කින් වැඩි විය.

### අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරුවලට අනුව එම අංශයේ වැටුප් එක් එක් අනුපාතයන්ගෙන් වැඩි වී ඇත.** රාජ්‍ය අංශයෙන් සහ විධිමත් පෞද්ගලික අංශයෙන් පරිබාහිර වූ අවිධිමත් පෞද්ගලික අංශයේ කෘෂිකර්මාන්තයට හා ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වැටුප් පිළිබඳ තොරතුරු, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ නිතිපතා ක්‍රමවත්ව පවත්වනු ලබන සමීක්ෂණයක් මගින් එක්රැස් කරනු ලැබේ. සාමාන්‍යයෙන්, ආර්ථිකයේ

**4.6 සංඛ්‍යා සටහන**

**අංශය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප්**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රු.) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත (ඇ) | |
| | 2008 (අ) | 2009 (අ) | 2010 (ආ)(ඈ) | 2009 | 2010 (ඈ) | 2009 | 2010 (ඈ) |
| 1. කෘෂිකාර්මික අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 440 | 488 | 543 | 10.9 | 11.3 | 7.2 | 5.0 |
| ස්ත්‍රී | 305 | 356 | 391 | 16.5 | 9.9 | 12.6 | 3.7 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 500 | 532 | 588 | 6.5 | 10.5 | 2.9 | 4.3 |
| ස්ත්‍රී | 377 | 416 | 463 | 10.1 | 11.4 | 6.4 | 5.2 |
| පොල් (ඉ) | | | | | | | |
| පුරුෂ | 590 | 651 | 699 | 10.4 | 7.4 | 6.7 | 1.3 |
| වී | | | | | | | |
| පුරුෂ | 562 | 613 | 658 | 9.1 | 7.3 | 5.5 | 1.3 |
| ස්ත්‍රී | 395 | 423 | 453 | 7.0 | 7.1 | 3.5 | 1.1 |
| 2. ඉදිකිරීම් අංශය (ඉ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 844 | 934 | 1,002 | 10.6 | 7.3 | 6.9 | 1.3 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 558 | 615 | 657 | 10.2 | 6.8 | 6.5 | 0.8 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 837 | 925 | 995 | 10.5 | 7.6 | 6.8 | 1.5 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 561 | 623 | 669 | 11.1 | 7.4 | 7.3 | 1.4 |

(අ) වැටුප් විස්තර මධ්‍යස්ථාන 90 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ආ) 2010 වසර සඳහා වූ වැටුප් විස්තර මධ්‍යස්ථාන 102 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ඇ) මූර්ත වැටුප් ප්‍රතිශත වෙනස කො.පා.මි.ද. (2002=100) පදනම්කොට ගෙන ගැලපුම් කර ඇත.
(ඈ) තාවකාලික
(ඉ) පොල් වගා සහ ඉදිකිරීම් අංශවල කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පවතින ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයත්, එම කම්කරුවන් බලාපොරොත්තු වන අවම වැටුප් මට්ටමත් පිළිබිඹු වන අයුරින් අසංවිධිත අංශයේ වැටුප් තීරණය වේ. ඒ අනුව, පසුගිය වසර හා සසඳන විට 2010 වර්ෂයේ දී කෘෂිකාර්මික හා ඉදිකිරීම් අංශවල පිළිවෙළින් සියයට 9.1 ක හා සියයට 7.3 ක දෛනික වැටුප් වැඩි වීමක් වාර්තා විය. කෘෂිකාර්මික අංශයේ රබර්, තේ, පොල් සහ වී යන උප කාණ්ඩවල සාමාන්‍ය දෛනික වැටුප් 2009 වර්ෂය හා සැසඳීමේ දී පිළිවෙළින් සියයට 11.0, සියයට 10.7, සියයට 7.9 සහ සියයට 7.3 කින් 2010 වර්ෂයේ දී වැඩි වී ඇත. තේ සහ රබර් යන උප කාණ්ඩවල වැටුප් අනෙක් අංශවලට සාපේක්ෂව ඉහළ වැඩි වීමක් පෙන්නුම් කළ අතර, ජාත්‍යන්තර වෙළඳපොළේ තේ සහ රබර් අපනයන මිල ගණන් වැඩි වීම නිසා අදාළ සේවකයන් සඳහා වැඩි වැටුපක් ගෙවීමට එම නිෂ්පාදකයන්ට හැකි වීම සහ විධිමත් වැවිලි කර්මාන්ත අංශයේ සේවකයන්ගේ වැටුප් ඉතා විශාල ලෙස වැඩි වීම මෙම ඉහළ යාමට හේතු වූවා විය හැකිය.

**කෘෂිකාර්මික සහ ඉදිකිරීම් අංශවල සියලුම උප කාණ්ඩයන්හි මූර්ත වැටුප්වල ඉහළ යෑමක් 2010 වර්ෂය තුළ දී වාර්තා විය.** ඒ අනුව, කෘෂිකාර්මික අංශයේ රබර්, තේ, පොල් සහ වී යන උප කාණ්ඩවල දෛනික සාමාන්‍ය මූර්ත වැටුප් පිළිවෙළින් සියයට 4.7, සියයට 4.5, සියයට 1.8 සහ සියයට 1.3 කින් වැඩි විය. මේ අතර, ඉදිකිරීම් අංශයෙහි වඩුකාර්මික සහ පෙදරේරු අංශවල මූර්ත වැටුප් පිළිවෙළින් සියයට 1.1 ක සහ සියයට 1.5 ක අඩු වර්ධනයක් වාර්තා විය. සමස්ත කෘෂිකාර්මික අංශයේ සහ ඉදිකිරීම් අංශයේ මූර්ත වැටුප්වල 2009 වර්ෂයේ දී වාර්තා වූ සියයට 8.2 ක සහ සියයට 6.9 ක වර්ධනය සමඟ සැසඳීමේ දී, එම අංශ දෙක 2010 වර්ෂය තුළ දී පිළිවෙළින් සියයට 3.0 ක සහ සියයට 1.3 ක අඩු වර්ධන තත්ත්වයක් වාර්තා කෙරිණි.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

### ජනගහනය

**2010 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 20.65 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2009 වර්ෂයේ දී සියයට 1.1 ක් වූ ජනගහන වර්ධනයට සාපේක්ෂව 2010 වර්ෂයේ දී සියයට 1.0 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.** ජනගහනයේ වැඩි වීම මුලතිව් දිස්ත්‍රික්කය හැර දිවයිනේ අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. 2010 වර්ෂයේ සමස්ත වැඩිවීමෙන් සියයට 60 කට වඩා වැඩි දායකත්වයක් සැපයූ කොළඹ, මහනුවර, කුරුණෑගල, රත්නපුර, බදුල්ල, ගම්පහ, ගාල්ල, අනුරාධපුරය සහ අම්පාර යන දිස්ත්‍රික්කවල වැඩි ජනගහන වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**4.7 සංඛ්‍යා සටහන** — **දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය**

පුද්ගලයන් '000

| දිස්ත්‍රික්කය | 2009 | 2010 (අ) | වෙනස (අ) | ප්‍රතිශත වෙනස (අ) |
|---|---|---|---|---|
| කොළඹ | 2521 | 2553 | 32 | 1.3 |
| මහනුවර | 1415 | 1431 | 16 | 1.1 |
| රත්නපුරය | 1113 | 1125 | 12 | 1.1 |
| බදුල්ල | 874 | 886 | 12 | 1.4 |
| කුරුණෑගල | 1550 | 1563 | 13 | 0.8 |
| ගම්පහ | 2165 | 2177 | 12 | 0.6 |
| ගාල්ල | 1074 | 1084 | 10 | 0.9 |
| අනුරාධපුරය | 820 | 830 | 10 | 1.2 |
| කළුතර | 1128 | 1135 | 7 | 0.6 |
| මාතර | 831 | 839 | 8 | 1.0 |
| නුවරඑළිය | 755 | 761 | 6 | 0.8 |
| අම්පාර | 634 | 644 | 10 | 1.6 |
| මඩකලපුව | 537 | 543 | 6 | 1.1 |
| පුත්තලම | 770 | 779 | 9 | 1.2 |
| යාපනය | 607 | 611 | 4 | 0.7 |
| මාතලේ | 490 | 497 | 7 | 1.4 |
| ත්‍රිකුණාමලය | 368 | 374 | 6 | 1.6 |
| හම්බන්තොට | 565 | 571 | 6 | 1.1 |
| මොණරාගල | 435 | 440 | 5 | 1.1 |
| පොළොන්නරුව | 405 | 410 | 5 | 1.2 |
| මුලතිව් | 154 | 148 | -6 | -3.9 |
| කිලිනොච්චිය | 154 | 156 | 2 | 1.3 |
| වව්නියාව | 169 | 174 | 5 | 3.0 |
| කෑගල්ල | 813 | 818 | 5 | 0.6 |
| මන්නාරම | 103 | 104 | 1 | 1.0 |
| **එකතුව** | **20,450** | **20,653** | **203** | **1.0** |

(අ) තාවකාලික — මූලය: රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

### ශ්‍රම බලකාය

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව වයස අවුරුදු 10 හා ඊට වැඩි, ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය ලෙස හඳුන්වනු ලබන ශ්‍රම බලකාය, පසුගිය වර්ෂයේ මිලියන 8.07 ට සාපේක්ෂව 2010 වර්ෂයේ දී මිලියන 8.11 දක්වා සුළු වශයෙන් වැඩි විය.**[1] මුළු ශ්‍රම බලකාය, මිලියන 7.71 ක් වන සේවා නියුක්තිකයන්ගෙන් හා මිලියන 0.40 ක් වන සේවා

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පදනම්ව ශ්‍රම බලකාය, සේවානියුක්තිය සහ සේවාවියුක්ති මට්ටම හා එහි ප්‍රවණතාවයන් විශ්ලේෂණය කරනු ලැබේ. 2008 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පළාත ද ඇතුළත් වන පරිදි කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය ව්‍යාප්ත කරන ලදී. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය තුළින් මුළු දිවයිනම ආවරණය වන පරිදි සමීක්ෂණ නියැදිය පුළුල් කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර තිබුණ ද, පසුගිය වසර කීපය තුළ දී උතුරු පළාත මුළුමනින්ම ආවරණය කර නොමැත. ඒ අනුව, විශේෂයෙන් සඳහන් කර නොමැති සෑම අවස්ථාවක දීම උතුරු පළාත හැර සෙසු දිස්ත්‍රික්කවල ශ්‍රම බලකා සමීක්ෂණවල දත්ත පමණක් විශ්ලේෂණය සඳහා භාවිතා කර ඇත.

**4.8 සංඛ්‍යා සටහන**

**කුටුම්භ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය**

| ශීර්ෂය | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) | 2009 (ආ) | 2010 (අ) | | | | | 2010 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| කුටුම්භ ජනගහනය (ඇ) පුද්ගලයන් '000 | 15,079 | 16,320 | 15,398 | 16,578 | 15,640 | 15,586 | 15,619 | 15,755 | 15,650 | 16,851 | 16,810 | 16,816 | 16,969 | 16,862 |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | 7,569 | 8,082 | 7,572 | 8,074 | 7,678 | 7,557 | 7,445 | 7,762 | 7,610 | 8,130 | 8,051 | 7,972 | 8,279 | 8,108 |
| සේවා නියුක්ත | 7,175 | 7,648 | 7,140 | 7,602 | 7,287 | 7,146 | 7,092 | 7,418 | 7,236 | 7,726 | 7,613 | 7,578 | 7,909 | 7,707 |
| සේවා වියුක්ත | 394 | 434 | 433 | 471 | 390 | 411 | 353 | 344 | 375 | 404 | 437 | 394 | 369 | 401 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)% | 50.2 | 49.5 | 49.2 | 48.7 | 49.1 | 48.5 | 47.7 | 49.3 | 48.6 | 48.2 | 47.9 | 47.4 | 48.8 | 48.1 |
| පුරුෂ | 67.9 | 67.8 | 66.7 | 66.6 | 67.8 | 67.6 | 67.1 | 66.7 | 67.3 | 67.3 | 67.3 | 67.1 | 66.9 | 67.1 |
| ස්ත්‍රී | 34.3 | 33.2 | 33.7 | 32.8 | 32.7 | 31.6 | 30.4 | 33.7 | 32.1 | 31.6 | 30.8 | 29.8 | 32.6 | 31.2 |

(අ) උතුරු හා නැගෙනහිර පලාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.
(ඇ) වයස අවු. 10 සහ ඊට වැඩි කුටුම්භ ජනගහනය
(ඈ) ශ්‍රම බලකාය, වයස අවුරුදු 10 හා ඊට වැඩි කුටුම්භ ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වියුක්තිකයන්ගෙන් සමන්විත විය. මේ අතර, වයස අවුරුදු 10 ට හා ඊට වැඩි ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය, පසුගිය වර්ෂයේ පැවති සියයට 48.7 සිට සියයට 48.1 දක්වා 2010 දී තවදුරටත් පහත වැටිණි. මෙම අඩු වීමට, 2009 දී සියයට 32.8 ක් වූ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 2010 වර්ෂයේ දී සියයට 31.2 දක්වා සැලකිය යුතු ලෙස අඩු වීම හේතු විය. මේ අතර, පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය පසුගිය වර්ෂයේ පැවති සියයට 66.6 සමඟ සැසඳීමේ දී 2010 වර්ෂයේ දී සියයට 67.1 දක්වා සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරිණි. අංශ අනුව දැක්වෙන පරිදි, ග්‍රාමීය අංශයේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය නාගරික අංශයට වඩා වැඩි බව පෙන්නුම් කරන අතර, නාගරික අංශයේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයට වඩා සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පවතී. එමෙන්ම, පසුගිය වර්ෂවල ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ස්ත්‍රී පුරුෂ භාවය අනුව විශ්ලේෂණය කළ විට, මෑත කාලයේ දී පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ස්ත්‍රී සහභාගිත්ව අනුපාතය මෙන් දෙගුණයකටත් වඩා ඉහළ වූ බව පෙන්නුම් කළ අතර පසුගිය වසර කිහිපය තුළ ස්ත්‍රී පක්ෂයේ සහභාගිත්ව අනුපාතය පහත වැටෙමින් පවතින බව නිරීක්ෂණය කෙරිණි.

## සේවා නියුක්තිය

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2009 දී මිලියන 7.60 ක් වූ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව, 2010 වර්ෂයේ දී මිලියන 7.71 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් වැඩි විය.**[2] මෙම වැඩි වීමට, ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු වීම හේතු කොටගෙන සේවකයන් සඳහා වැඩි වෙමින් පැවති ඉල්ලුම හේතු වූවා විය හැකිය.

**සේවා නියුක්ති ජනගහනයෙහි සංයුතිය ප්‍රධාන කර්මාන්ත කාණ්ඩ අතරේ බෙදී ගොස් ඇති ආකාරය මෙම කාලච්ඡේද දෙක අතර වෙනස් වී ඇත.** ඒ අනුව, කෘෂිකාර්මික අංශයෙන් සහ සේවා අංශයෙන් මුළු සේවා නියුක්තියට ලැබුණු දායකත්වය 2010 වර්ෂයේ දී වැඩි වී ඇති අතර, කර්මාන්ත අංශයෙන් ලැබුණු දායකත්වයේ සුළු අඩු වීමක් වාර්තා විය. පසුගිය වර්ෂ කිහිපය තුළම මුළු ආර්ථික වර්ධනය සඳහා ඉහළම දායකත්වයක් සැපයූ සේවා අංශය 2010 වර්ෂය තුළ දී ද වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කරමින් මූලිකත්වය ගන්නා ලදී. ඒ අනුව, මුළු සේවා නියුක්තියට සේවා අංශයේ දායකත්වය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සියයට 42.3 සිට 2010 වර්ෂයේ දී සියයට 43.1 දක්වා වැඩි විය. සේවා අංශයේ සිදු වූ මෙම සේවා නියුක්තිකයේ වැඩි වීම ප්‍රධාන වශයෙන් පෞද්ගලික සේවා හා අදාල වෙනත් සේවා අංශයේ සිදු වූ අතර, එය මූලික වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම්වල ඇති වූ ප්‍රසාරණය හේතුවෙන් සිදු විය.

[2] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව නිර්වචනය කර ඇති පරිදි සමීක්ෂණය සිදු කළ කාලච්ඡේදය තුළ වැටුපක්, ලාභයක් හෝ පවුලට යම් ප්‍රතිලාභයක් (ගෙවීමක් නොලබන) ලබා ගැනීම සඳහා යම් කාර්යයක නියුක්තව සිටි පුද්ගලයෙක් සේවානියුක්තිකයකු ලෙස සැලකේ. සේවා තත්ත්වය අනුව සලකා බැලීමේ දී කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පවත්වන ලද කාලච්ඡේදය තුළ, යම් ගෙවීමක් ලබන සේවකයන්, සේවායෝජකයන්, ස්වයං රැකියාවල නියුතු අය හෝ ගෙවීමක් නොලබන පවුලේ සේවකයන්, සේවානියුක්තිකයන් ලෙස ගණන් ගැනේ. සමීක්ෂණය පැවති කාලයේ දී වැඩක නොයෙදුණ ද රැකියාවක් ඇති පුද්ගලයන් සේවානියුක්තිකයන් ලෙස පිළිගැනේ. අසනීප වීම, අයහපත් කාලගුණ තත්ත්වය හෝ කාර්මික ආරවුල් හේතු කොට ගෙන තාවකාලිකව සේවයට වාර්තා නොකළ ද, එම පුද්ගලයන් ද සේවා නියුක්තිකයන් ලෙස සැලකේ.

**4.9 සංඛ්‍යා සටහන**

## ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය

| අංශය | 2009 (අ) | 2009 (ආ) | පුද්ගලයන් '000 2010 (අ) පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | 2010 (ආ) පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය 2009 (අ) | 2009 (ආ) | 2010 (අ) | 2010 (ආ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මය** | **2,319** | **2,476** | **2,456** | **2,299** | **2,197** | **2,462** | **2,354** | **2,600** | **2,439** | **2,367** | **2,672** | **2,520** | **32.5** | **32.6** | **32.5** | **32.7** |
| **කර්මාන්ත** | **1,823** | **1,910** | **1,835** | **1,696** | **1,756** | **1,821** | **1,777** | **1,911** | **1,795** | **1,850** | **1,910** | **1,867** | **25.5** | **25.1** | **24.6** | **24.2** |
| නිමැවුම් කර්මාන්ත | 1,301 | 1,348 | 1,321 | 1,222 | 1,251 | 1,287 | 1,270 | 1,356 | 1,274 | 1,301 | 1,342 | 1,318 | 18.2 | 17.7 | 17.6 | 17.1 |
| ඉදිකිරීම් (ඇ) | 522 | 562 | 514 | 474 | 506 | 534 | 507 | 555 | 521 | 549 | 568 | 548 | 7.3 | 7.4 | 7.0 | 7.1 |
| **සේවා** | **2,999** | **3,216** | **2,996** | **3,150** | **3,139** | **3,134** | **3,105** | **3,214** | **3,379** | **3,360** | **3,327** | **3,320** | **42.0** | **42.3** | **42.9** | **43.1** |
| වෙළඳාම සහ හෝටල් ආදිය | 1,047 | 1,119 | 1,082 | 1,096 | 1,201 | 1,121 | 1,125 | 1,149 | 1,183 | 1,262 | 1,192 | 1,196 | 14.7 | 14.7 | 15.5 | 15.5 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 420 | 445 | 451 | 480 | 454 | 465 | 463 | 471 | 506 | 474 | 486 | 484 | 5.9 | 5.9 | 6.4 | 6.3 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 221 | 227 | 231 | 240 | 285 | 268 | 256 | 237 | 245 | 295 | 281 | 264 | 3.1 | 3.0 | 3.5 | 3.4 |
| පෞද්ගලික සේවා සහ අදාළ වෙනත් සේවා | 1,311 | 1,426 | 1,232 | 1,333 | 1,199 | 1,281 | 1,261 | 1,357 | 1,445 | 1,330 | 1,367 | 1,375 | 18.4 | 18.8 | 17.4 | 17.9 |
| **මුළු සේවා නියුක්තිය** | **7,140** | **7,603** | **7,287** | **7,146** | **7,092** | **7,418** | **7,236** | **7,726** | **7,613** | **7,578** | **7,909** | **7,707** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 94.3 | 94.2 | 94.9 | 94.6 | 95.3 | 95.6 | 95.1 | 95.0 | 94.6 | 95.1 | 95.5 | 95.0 | | | | |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ඇ) පතල් හා කැණීම්, විදුලිය, ගෑස් සහ ජලය යන උප අංශ ඉදිකිරීම් යටතේ වර්ගීකරණය කර ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ අතර, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය 2009 පැවති සියයට 32.6 සිට 2010 දී සියයට 32.7 දක්වා වැඩි වූ අතර, කර්මාන්ත අංශයේ සේවා නියුක්ති දායකත්වය 2009 වර්ෂයේ පැවති සියයට 25.1 සිට 2010 වර්ෂයේ දී සියයට 24.2 දක්වා පහත වැටිණි. කර්මාන්ත අංශයේ සිදු වූ මෙම අඩු වීම නිෂ්පාදන හා ඉදිකිරීම් යන දෙ අංශයේම සිදු වී ඇති බව නිරීක්ෂණය කෙරිණි.

**4.10 සංඛ්‍යා සටහන**

## සේවා නියුක්ති මූලයන්

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2008 (අ) | 14.9 | 41.1 | 3.0 | 30.2 | 10.8 | 100.0 |
| 2008 (ආ) | 15.2 | 41.2 | 2.9 | 30.3 | 10.5 | 100.0 |
| 2009 (අ) | 15.2 | 42.1 | 2.7 | 29.0 | 11.0 | 100.0 |
| 2009 (ආ) | 15.5 | 42.1 | 2.6 | 29.2 | 10.6 | 100.0 |
| **2010 (වාර්ෂික) (අ)** | **13.9** | **41.3** | **2.7** | **31.5** | **10.7** | **100.0** |
| පළමු කාර්තුව | 13.5 | 41.5 | 2.4 | 31.6 | 11.0 | 100.0 |
| දෙවන කාර්තුව | 13.9 | 42.3 | 2.7 | 30.4 | 10.6 | 100.0 |
| තෙවන කාර්තුව | 14.1 | 41.2 | 3.2 | 31.8 | 9.8 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.0 | 40.2 | 2.4 | 32.0 | 11.4 | 100.0 |
| **2010 (වාර්ෂික) (ආ)** | **14.3** | **41.2** | **2.6** | **31.5** | **10.4** | **100.0** |
| පළමු කාර්තුව | 14.2 | 41.4 | 2.4 | 31.4 | 10.7 | 100.0 |
| දෙවන කාර්තුව | 14.1 | 42.2 | 2.6 | 30.7 | 10.3 | 100.0 |
| තෙවන කාර්තුව | 14.6 | 41.1 | 3.1 | 31.7 | 9.5 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.2 | 40.2 | 2.4 | 32.1 | 11.1 | 100.0 |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුලත් කර නොමැත.
(ආ) උතුරු පලාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.11 සංඛ්‍යා සටහන** **රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2008 | 2009 | 2010 (අ) | ප්‍රතිශත වෙනස 2009/ 2008 | ප්‍රතිශත වෙනස 2010/ 2009 (අ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 990,410 | 1,047,041 | 1,027,179 | 5.7 | -1.9 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 261,318 | 266,543 | 271,923 | 2.0 | 2.0 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,251,728** | **1,313,584** | **1,299,102** | **4.9** | **-1.1** |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවා නියුක්තිය එහි ස්වභාවය අනුව වර්ග කළ විට, මුළු සේවා නියුක්තියට ස්වයං රැකියාවල නියුතු සේවකයන්ගෙන් ලැබුණු දායකත්වය 2010 වර්ෂය තුළ දී වැඩි වී ඇති අතර, සේවා යෝජකයන්ගෙන් ලැබුණු දායකත්වය 2009 වර්ෂයේ පැවති මට්ටමින්ම නොවෙනස්ව පැවතිණි.** කෙසේ නමුත්, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් යන කාණ්ඩවල දායකත්වය 2009 වර්ෂය සමඟ සැසැඳීමේ දී පහත වැටී ඇත. 2010 වර්ෂය තුළ දී මුළු සේවා නියුක්තියට පෞද්ගලික අංශයෙන් ලැබුණු දායකත්වයේ පහත වැටීමක් පෙන්නුම් කළ ද, මුළු සේවා නියුක්තියෙන් සියයට 14.3 ක් වූ රාජ්‍ය අංශය හා සසඳන විට, සේවා නියුක්තියට සියයට 41.2 ක විශාල දායකත්වයක් වාර්තා කරමින් පෞද්ගලික අංශය 2010 වර්ෂය තුළ දී ද තවදුරටත් එහි ප්‍රමුඛතාවය පවත්වා ගෙන යනු ලැබිණි. මේ අතර, මුළු සේවා නියුක්තියට දක්වන දායකත්වය අතින් දෙවැනි ස්ථානය ගනු ලබන ස්වයං රැකියා කාණ්ඩය ද 2010 වර්ෂය තුළ දී වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කරන ලදී. ස්වයං රැකියාවල නියුක්තිකයන්ගේ සහ සේවා යෝජක සංඛ්‍යාවේ ඇති වූ වර්ධනයෙන් සාමය උදා වීමෙන් පසුව ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි වීමත්, ආර්ථිකය තුළ සිදු වූ වර්ධන අවස්ථාවන් වැඩි වීමත් පෙන්නුම් කරයි.

## සේවා වියුක්තිය

**කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව පුළුල් පදනමකින් යුතුව ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශයන්හි ඇති වූ වර්ධනය අනුව යමින්, 2009 වර්ෂයේ පැවති සියයට 5.8 ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ති අනුපාතය 2010 වර්ෂයේ දී සියයට 4.9 ක් දක්වා අඩු විය.** පසුගිය වර්ෂයේ දී 471,000 ක් වූ සේවා වියුක්තිකයන්ගේ සංඛ්‍යාව 2010 වර්ෂයේ දී 401,000 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණි.

**4.2 රූප සටහන** **ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවයන් 2007-2010**




සටහන: 2007 සේවා වියුක්ති අනුපාතිකයට උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත් නොවේ.

**කෙසේ නමුත්, නොකඩවා පවතින තරුණ සේවා වියුක්තිය, විශේෂයෙන්ම, උගත් තරුණයන් අතර සේවා වියුක්තිය අවධානය යොමු කළ යුතු කරුණක් ලෙස තවදුරටත් පවතී.** මෙම තත්ත්වය උගත් තරුණ පුරුෂ පක්ෂයට වඩා තරුණ කාන්තා පක්ෂය අතර වඩාත් තියුණු මුහුණුවරක් ගෙන ඇත. අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය සලකා බැලීමේ දී සියයට 11.6 ක වැඩිම සේවා වියුක්ති අනුපාතය වාර්තා වන්නේ අ.පො.ස. (උ.පෙළ) සහ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් අතරෙහි වන අතර, ඉන්පසු වැඩි සේවා වියුක්ති අනුපාතය වූ සියයට 6.9 අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් සහිත පුද්ගල කාණ්ඩය තුළින් වාර්තා වේ. අ.පො.ස. (උ.පෙළ) සහ ඊට වැඩි අධ්‍යාපන මට්ටමක් සහිත සේවක කාණ්ඩය තුළ 2008 වර්ෂයේ සිට වැඩි වන ප්‍රවණතාවක් පෙන්නුම් කරන සේවා වියුක්තිය, සත්‍ය වශයෙන්ම අසතුටුදායක තත්ත්වයකි. ශ්‍රම වෙළඳපොළේ පවතින රැකියා අවස්ථාවන් සහ සේවා වියුක්තිකයන්ගේ අපේක්ෂාවන් හා ඔවුන්ගේ නිපුණතාවන් අතර නොකඩවා පවතින නොගැළපීම මෙම ගැටළුවට එක් හේතුවක් විය හැකිය.

**පසුගිය වසර කිහිපය තුළ දී නිරීක්ෂණය වූ පරිදි අවුරුදු 15-29 වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවතිණි.** කෙසේ නමුත්, කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ ඇස්තමේන්තුවලට අනුව මෙම වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය 2009 වර්ෂයේ වූ සියයට 16.1 සිට 2010 වර්ෂයේ දී සියයට 14.8 දක්වා අඩු විය. වඩා පැහැදිලිව සඳහන් කළහොත්, අවුරුදු 15-19 සහ අවුරුදු 20-29 යන වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාත 2009 වර්ෂයේ පැවති සියයට 20.9 සහ සියයට 15.4 සිට පිළිවෙළින් සියයට 20.3 සහ

**4.12 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| ශීර්ෂය | 2008 (අ) | 2008 (ආ) | 2009 (අ) | 2009 (ආ) | 2010 (අ) පළමු කාර්තුව | 2010 (අ) දෙවන කාර්තුව | 2010 (අ) තෙවන කාර්තුව | 2010 (අ) සිව්වන කාර්තුව | 2010 (අ) වාර්ෂික | 2010 (ආ) පළමු කාර්තුව | 2010 (ආ) දෙවන කාර්තුව | 2010 (ආ) තෙවන කාර්තුව | 2010 (ආ) සිව්වන කාර්තුව | 2010 (ආ) වාර්ෂික |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත | 5.2 | 5.4 | 5.7 | 5.8 | 5.1 | 5.4 | 4.7 | 4.9 | 4.9 | 5.0 | 5.4 | 4.9 | 4.5 | 4.9 |
| ස්ත්‍රී පුරුෂ අනුව | | | | | | | | | | | | | | |
| පුරුෂ | 3.6 | 3.7 | 4.3 | 4.3 | 3.5 | 4.2 | 3.4 | 2.9 | 3.5 | 3.4 | 4.1 | 3.6 | 2.9 | 3.5 |
| ස්ත්‍රී | 8.0 | 8.4 | 8.2 | 8.6 | 7.9 | 7.7 | 7.4 | 7.2 | 7.5 | 7.9 | 8.0 | 7.7 | 7.3 | 7.7 |
| වයස් කාණ්ඩ අනුව (අවුරුදු) | | | | | | | | | | | | | | |
| 15-19 | 20.6 | 20.8 | 21.2 | 20.9 | 21.6 | 24.2 | 18.7 | 19.8 | 21.1 | 20.2 | 22.1 | 18.2 | 20.5 | 20.3 |
| 20-29 | 13.2 | 13.7 | 15.1 | 15.4 | 14.5 | 14.9 | 13.1 | 12.2 | 13.7 | 14.3 | 14.9 | 13.8 | 12.3 | 13.8 |
| 30-39 | 3.1 | 3.1 | 3.6 | 3.7 | 2.9 | 3.2 | 3.0 | 3.4 | 3.1 | 2.8 | 3.1 | 3.1 | 3.4 | 3.1 |
| 40 සහ ඊට ඉහළ | 1.2 | 1.2 | 1.4 | 1.4 | 1.0 | 1.2 | 1.2 | 0.8 | 1.0 | 1.0 | 1.2 | 1.2 | 0.8 | 1.0 |
| අධ්‍යාපන මට්ටම අනුව | | | | | | | | | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | 1.1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 4.5 | 4.5 | 4.9 | 5.0 | 3.6 | 3.8 | 3.5 | 3.4 | 3.6 | 3.5 | 4.0 | 3.5 | 3.5 | 3.6 |
| අ.පො.ස. (සා.පෙ)/ජා.පො.අ.ස | 7.4 | 7.8 | 8.1 | 8.5 | 7.3 | 8.0 | 7.0 | 5.6 | 6.9 | 7.0 | 7.8 | 7.5 | 5.6 | 6.9 |
| අ.පො.ස. (උ.පෙ)/උ.ජා.අ.ස සහ ඊට ඉහළ | 9.9 | 10.5 | 10.8 | 11.2 | 11.9 | 12.3 | 10.6 | 10.6 | 11.3 | 12.0 | 12.3 | 11.1 | 10.8 | 11.6 |

(අ) උතුරු හා නැගෙනහිර පළාත් දෙකෙහි දත්ත ඇතුළත් කර නොමැත.
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුළත් කර නොමැත.

මූලයා: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සියයට 13.8 දක්වා 2010 වර්ෂයේ දී පහත වැටිණි. 2010 වර්ෂයේ දී සියයට 10.9 ක් වූ තරුණ පුරුෂ පක්ෂයේ සේවා වියුක්ති අනුපාතයට වඩා සියයට 21.7 ක් වූ තරුණ කාන්තා පක්ෂයේ සේවා වියුක්ති අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවතිණි. කෙසේ නමුත්, මෙම සේවා වියුක්ති අනුපාත දෙකම පසුගිය වසරට වඩා අඩු මට්ටමක පැවතිණි.

### විදේශ සේවා නියුක්තිය

**2009 වර්ෂයේ පැවති තාවකාලික පසු බැසීමෙන් පසු 2010 වර්ෂයේ දී ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථාවන් හිමි වීම වඩාත් හොඳින් යථා තත්ත්වයට පත් වූ අතර, විදේශ සේවා නියුක්තිය තවදුරටත් සේවා නියුක්තියෙහි ප්‍රධාන මූලාශ්‍රයක් විය.** සාමාන්‍ය රටාව අනුව යමින් 2010 මුල් කාර්තු තුන තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ ගිය අතර, වර්ෂයේ අවසන් කාර්තුවේ දී එහි සුළු පහළ යෑමක් වාර්තා විය. විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව 2009 හි වූ 247,126 සමඟ සසඳන විට 2010 දී 266,445 දක්වා සියයට 7.8 කින් වර්ධනය විය. අර්ධ පුහුණු සහ ගෘහ සේවිකා යන කාණ්ඩවල විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාවෙහි අඩු වීමක් දැකිය හැකි විය. මේ අතර, වෘත්තිකයන්, මධ්‍යම මට්ටමේ සහ ලිපිකරු හා අදාළ සේවකයන්, පුහුණු කම්කරු මෙන්ම නුපුහුණු කම්කරු කාණ්ඩවල විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීමේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය.

**ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ සුබසාධනය වැඩිදියුණු කරමින් 2010 දී විදේශ රැකියා අවස්ථාවන් වැඩිපුර ආකර්ෂණය කර ගැනීම සඳහා අදාළ අධිකාරීන් විසින් ප්‍රතිපත්තිමය නිර්දේශයන් රැසක් හඳුන්වා දෙනු ලැබිණි.** ඒ අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) උපදේශකත්වය සහිතව කම්කරු සංක්‍රමණිකයන්ට අදාළ ප්‍රධාන ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික කම්කරු සංක්‍රමණ ප්‍රතිපත්තියක් සැකසිණි. සංක්‍රමික සේවකයන් සඳහා යහ පාලනයක් ඇති කිරීම හා අදාළ රෙගුලාසි සැකසීම, ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයන් සඳහා ඵලදායී ආරක්ෂණයක් හා සේවාවක් සැපයීම සහ නැවත පැමිණෙන්නන් යළි ඒකාබද්ධ කිරීම හා වැඩි ප්‍රේෂණ ප්‍රමාණයක් එක්රැස් කිරීම, මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ඉලක්කයන් විය. තව ද, ද්විපාර්ශ්වික ගිවිසුම්, අවබෝධතා ගිවිසුම්, සත්කාරක රටවල සිටින සංක්‍රමික සේවකයන්ට අදාළ ප්‍රතිපත්ති පිළියෙළ කිරීම සඳහා එම රටවලට බලපෑම් කිරීම සහ විදේශ රටවල පිහිටි ශ්‍රී ලාංකික දූත සේවාවන් මගින් සංක්‍රමික ශ්‍රමික සබඳතා වඩාත් හොඳින් සම්බන්ධීකරණය කිරීම හරහා සංක්‍රමික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සබඳතා පහසු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති (ශ්‍රී.ලං.වි.සේ.නි.) කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂය සීමාව යටතට ගැණිනි.

**කාන්තා සංක්‍රමික සේවකයන් සඳහා පැවැත්වුණු අනිවාර්ය පුහුණු වැඩසටහන්වලට අමතරව ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය මගින් පිරිමි සේවකයන්**

**4.13 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2008 | | 2009 | | 2010 (අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා සංඛ්‍යාව | 250,499 | 100.0 | 247,126 | 100.0 | 266,445 | 100.0 |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 160,973 | 64.3 | 156,567 | 63.3 | 160,700 | 60.3 |
| වෙනත් | 89,526 | 35.7 | 90,559 | 36.7 | 105,748 | 39.7 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 128,232 | 51.1 | 119,381 | 48.3 | 135,502 | 50.9 |
| ස්ත්‍රී | 122,267 | 48.9 | 127,745 | 51.7 | 130,946 | 49.1 |
| ශ්‍රම කාණ්ඩ අනුව | | | | | | |
| වෘත්තීය | 2,835 | 1.1 | 2,832 | 1.1 | 2,974 | 1.1 |
| මධ්‍යම | 8,727 | 3.5 | 6,388 | 2.6 | 6,720 | 2.5 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 6,791 | 2.7 | 6,719 | 2.7 | 7,795 | 2.9 |
| පුහුණු ශ්‍රමික | 59,718 | 23.8 | 61,321 | 24.8 | 71,114 | 26.7 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 5,326 | 2.1 | 6,015 | 2.4 | 4,857 | 1.8 |
| නුපුහුණු ශ්‍රමික | 59,239 | 23.6 | 50,173 | 20.3 | 59,898 | 22.5 |
| ගෘහ සේවිකා | 107,923 | 43.1 | 113,678 | 46.0 | 113,087 | 42.4 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

සඳහා ද දින පහක අනිවාර්ය හැකියා වර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී. ප්‍රධාන කාර්යාලය සහ එහි දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය කාර්යාල, සහ ශ්‍රමිකයන් ලබා ගන්නා රටවල පිහිටි ශ්‍රී ලාංකික දූත සේවාවන් හා දේශීය සේවකයන් බඳවා ගැනීමේ නියෝජිතයන් සමඟ සබඳතාවන් පවත්වා ගැනීම සඳහා වඩා වැදගත් වන පරිගණක ජාල පද්ධතියක් ද සකසනු ලැබිණි. තව ද, විදේශ රැකියා සඳහා සංක්‍රමික ශ්‍රමිකයන් යෙදවීම සම්බන්ධයෙන් බඳවා ගැනීමේ නියෝජිත ආයතන මගින් සපයනු ලබන අගනා සේවය සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනවල කාර්ය සාධනය ඇගයීමට සහ ඔවුනට ජාතික මට්ටමේ පිළිගැනීමක් ලබා දීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ තාක්ෂණික සහයෝගය ඇතිව, ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් ශ්‍රේණිගත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලදී. තව ද, ශ්‍රී ලාංකික සංක්‍රමික ශ්‍රමිකයන්ගේ ආරක්ෂණය සහ සුබසාධනය ඉහළ නැංවීමේ අරමුණෙන් විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය, ජෝර්දානය, ලිබියාව, කටාර්, බහරේන් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සමහර අරාබි රටවල් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් කිහිපයක් අත්සන් කැරිණි. අනෙකුත් බොහෝ සුබසාධන සහ ආරක්ෂණ වැඩපිළිවෙළවල් සමඟ ක්‍රියාත්මක වන මෙම නව ක්‍රියාමාර්ගයන්, අනාගතයේ දී විදේශ සේවා නියුක්තිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

**සම්ප්‍රදායික වෙළඳපොළවලින් පරිබාහිර රටවල වැඩි සේවානියුක්ති අවස්ථාවන් ලබා ගැනීම සඳහා සහ තාක්ෂණික කුසලතා සහිත රැකියාවන් සඳහා ශ්‍රී ලාංකිකයන් දිරිමත් කිරීම වෙනුවෙන් අදාළ අධිකාරීන් විසින් දරණ ලද සාමූහික ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස 2010 වර්ෂයේ මිනිස්බල කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාවෙහි වෙනසක් සිදු විය.** සේවා නියුක්ති අංශයෙහි අඛණ්ඩව ප්‍රමුඛත්වය දරන ගෘහ සේවිකාවන්ගේ විදේශගත වීම් සංඛ්‍යාව 2010 වර්ෂයේ දී 113,087 දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් තවදුරටත් අඩු විය. එම තත්ත්වයට අනුරූපීව, සේවා නියුක්තිය සඳහා මුළු විදේශගත වීම්වලින් ගෘහ සේවිකාවන්ගේ සාපේක්ෂ වැදගත්කම ද 2009 හි පැවති සියයට 46.0 හි සිට 2010 දී සියයට 42.4 දක්වා අඩු විය. කෙසේ වුව ද, පුහුණු මෙන්ම නුපුහුණු ශ්‍රමික, සහ ලිපිකරු හා අදාළ සේවක කාණ්ඩවල, එක් එක් මිනිස්බල කාණ්ඩයේ සාපේක්ෂ දායකත්වය 2009 වර්ෂය සමඟ සසඳන විට ඉහළ යෑම් වාර්තා කළේය. මෙයට අමතරව, විදේශගත වූ සංඛ්‍යාව සැලකීමේ දී පුහුණු ශ්‍රමිකයන්ගේ (9,793 කින්) සහ නුපුහුණු ශ්‍රමිකයන්ගේ (9,725 කින්) ඉතා සැලකිය යුතු වර්ධනයක් සිදු විය. කෙසේ වුව ද, අර්ධ පුහුණු ශ්‍රමික කාණ්ඩයෙහි මෙම වර්ෂ දෙක අතර 1,158 ක අඩු වීමක් සිදු විය. මධ්‍යම මට්ටමේ ශ්‍රම කාණ්ඩය යටතේ විදේශගත වූ සේවකයන්ගේ සංඛ්‍යාවෙහි වැඩි වීමක් සිදු වුව ද, විදේශගත වූ මුළු සංඛ්‍යාවට සාපේක්ෂව එහි වැදගත්කම වර්ෂය තුළ දී

**4.14 සංඛ්‍යා සටහන — ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2009 | | 2010 (අ) | | වෙනස (අ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| කටාර් | 43,744 | 17.7 | 53,632 | 20.1 | 9,888 | 22.6 |
| සෞදි අරාබියාව | 77,826 | 31.5 | 70,890 | 26.6 | -6,936 | -8.9 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 39,586 | 16.0 | 42,069 | 15.8 | 2,483 | 6.3 |
| කුවේට් | 42,400 | 17.2 | 48,105 | 18.1 | 5,705 | 13.5 |
| වෙනත් | 43,563 | 17.6 | 51,749 | 19.4 | 8,186 | 18.8 |
| **එකතුව** | **247,119** | **100.0** | **266,445** | **100.0** | **19,326** | **7.8** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

සුළු වශයෙන් අඩු විය. කෙසේ වුව ද, 2009 දී පුරුෂ සංක්‍රමිකයන්ගේ දැකිය හැකි වූ තාවකාලික පහළ යෑමට එරෙහිව 2010 දී එහි වැඩි වීමක් සිදු විය. ඒ අනුව, 2009 දී මුළු විදේශගත වීම්වලින් සියයට 48 ක් වූ පුරුෂ සංක්‍රමණ සංඛ්‍යාව 2010 දී සියයට 51 දක්වා ඉහළ නැගිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ස්ත්‍රී පුරුෂ සංයුතිය අනුව මුළු විදේශගත වීම්වල පුරුෂ:ස්ත්‍රී අනුපාතිකය පසුගිය වසරේ පැවති 48:52 සමඟ සසඳන විට 2010 දී 51:49 ක් ලෙස වාර්තා විය.

**බහුතරය ගෘහ සේවිකාවන්ගෙන් සමන්විත වූ, සංක්‍රමණික ශ්‍රම බලකායේ විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යෑම්වලින් සියයට 90 කට වඩා නියෝජනය කරන මැද පෙරදිග කලාපය, විදේශ රැකියා වෙළඳපොළෙහි අඛණ්ඩව ප්‍රමුඛත්වය දැරීය.** මැද පෙරදිග කලාපය තුළ සෞදි අරාබිය, කටාර්, කුවේට් සහ එක්සත් ආරාබි එමීර් රාජ්‍යය 2010 දී විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම්වලින් සියයට 80.6 ක් සඳහා දායක විය. මෙම රටවල් අතුරින් 2009 දී මුළු සංක්‍රමික ශ්‍රමිකයන්ගෙන් සියයට 49.2 ක් සඳහා සෞදි අරාබිය සහ කටාර් රාජ්‍යය තනිව දායක වූ අතර, සෞදි අරාබිය සඳහා පිටත්ව ගිය සංක්‍රමික ශ්‍රමිකයන් සංඛ්‍යාව අඩු වීම හේතු කොට ගෙන 2010 දී මෙම දෙරටේ දායකත්වය සියයට 46.7 දක්වා අඩු විය. ඒ අනුව, 2010 දී කටාර් රාජ්‍යය වෙත පිටත්ව යෑම්හි දැකිය හැකි වූ සියයට 22.6 ක සැලකිය යුතු ඉහළ යෑම සෞදි අරාබිය වෙත පිටත්ව යෑම්වල සිදු වූ සියයට 8.9 ක පහළ යෑම මගින් ආංශිකව සමනය විය. 2009 සමඟ සසඳන විට 2010 දී කුවේට් රාජ්‍යය හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත සංක්‍රමණය වීම් පිළිවෙළින් සියයට 13.5 කින් සහ සියයට 6.3 කින් වැඩි විය. සංක්‍රමික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සහ ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා කුවේටය, ඕමානය, ජෝර්දානය, ලිබියාව, කටාර් රාජ්‍යය, බහරේන් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි ශ්‍රමය ලබා ගන්නා රටවල් සමඟ විදේශ සේවා නියුක්ති ප්‍රවර්ධන සහ සුබසාධන අමාත්‍යාංශය එළඹ ඇති ද්විපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් මගින් විදේශ සේවා නියුක්තිය වඩාත් ආකර්ෂණීය වනු ඇත. මෙයට අමතරව, ක්ෂේත්‍රයේ විවිධ පාර්ශ්වයන් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ ජාලය සංවර්ධනය කිරීම තුළින් සහ රජය අනෙකුත් රාජ්‍යයන් සමඟ ශ්‍රමිකයන් බඳවා ගැනීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් අනාගතයේ දී විදේශයන්හි රැකියා අවස්ථා තවදුරටත් වැඩිදියුණු වනු ඇත.

**විදේශ සේවා නියුක්තිය, තවදුරටත් රට තුළට විදේශ විනිමය ගලා එන වැදගත් හා ස්ථාවර මූලාශ්‍රයක් විය.** සංක්‍රමික ශ්‍රමික ජනගහනයේ සිදු වූ වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස, පෙර වර්ෂයේ දී එ.ජ.ඩොලර් මිලියන 3,330 ක් වූ මුළු විදේශ සංක්‍රාම, 2010 දී එ.ජ.ඩොලර් මිලියන 4,116 ක් දක්වා සියයට 23.6 කින් ඉහළ නැගිණි. සම්ප්‍රදායික නොවන වෙළඳපොළවල නව වෙළඳපොළ අවස්ථාවන් සොයා ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයන්, සංක්‍රමික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනිසි ක්‍රියා පිටුදැකීම සඳහා කළ අදාළ නීති සංශෝධනයන් සහ අනෙකුත් ආරක්ෂණ හා සුබසාධන ප්‍රතිපත්ති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම තුළින්, විදේශ රැකියා අවස්ථාවන් සහ රටෙහි විදේශ විනිමය සංක්‍රාම තවදුරටත් වැඩිදියුණු කිරීමට මග පාදනු ඇත.

## ශ්‍රම ඵලදායිතාවය

**සමස්ත ශ්‍රම ඵලදායිතාවය, පසුගිය වර්ෂ කිහිපය තුළ පැවති ඉහළ යෑමේ ප්‍රවණතාවය අනුව යමින් 2010 වර්ෂයේ දී ද තවදුරටත් වැඩි විය.** එක් ශ්‍රමිකයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය (2002 වර්ෂයේ ස්ථාවර මිල ගණන් මත පදනම් වූ) අනුව මනිනු ලබන ශ්‍රම ඵලදායිතාවය

**4.15 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව**

| ශීර්ෂය | 2008 | 2009 | 2010 (අ) |
|---|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව | | | |
| ද.දේ.නි. (රු. මිලියන) | 2,365,501 | 2,449,214 | 2,645,432 |
| කෘෂිකාර්මික | 285,897 | 295,097 | 315,644 |
| කර්මාන්ත | 672,791 | 701,129 | 760,219 |
| සේවා | 1,406,813 | 1,452,988 | 1,569,569 |
| ශ්‍රම ඵලදායීතාව එක් | | | |
| පුද්ගලයකු සඳහා රු. '000 (ආ) | 309.3 | 322.2 | 343.3 |
| කෘෂිකාර්මික | 114.8 | 119.2 | 125.3 |
| කර්මාන්ත | 335.6 | 367.1 | 407.2 |
| සේවා | 446.1 | 451.8 | 472.8 |

(අ) තාවකාලික
(ආ) උතුරු පළාතෙහි දත්ත ඇතුලත් කර නොමැත.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පසුගිය වර්ෂයට වඩා සියයට 6.6 කින් වැඩි වෙමින් එක් ශ්‍රමිකයකුගේ ශ්‍රම ඵලදායිතාවය රුපියල් 343,300 දක්වා වැඩි විය. ශ්‍රම ඵලදායිතාවයේ මෙම වැඩි වීමට වර්ෂය තුළ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන වන කර්මාන්ත අංශයේ (සියයට 10.9), කෘෂිකර්මාන්ත අංශයේ (සියයට 5.1) සහ සේවා අංශයේ (සියයට 4.6) ඵලදායිතාවයේ ඇති වූ වර්ධනයන් ප්‍රධාන වශයෙන් දායක විය.

**ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහි ශ්‍රම ඵලදායිතාවයේ ඇති වන වර්ධනයන්, ආර්ථිකයේ ඇතිවන උද්ධමන පීඩනය පාලනය කරමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට වැදගත් වේ.** වැඩිදියුණු කළ බීජ වර්ග, නව තාක්ෂණය හා යාන්ත්‍රීකරණය යොදා ගැනීම පිළිබඳ සාර්ථක ව්‍යාප්ත සේවා හරහා ගොවියා දැනුවත් කිරීම තුළින් කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය වර්ධනය කිරීමට තවදුරටත් අවකාශ ඇත. මීට අමතරව, කෘෂිකාර්මික අංශය පදනම් කරගත් අගය වැඩි කිරීමේ සැකසුම් කර්මාන්ත වර්ධනය කිරීම, විධිමත් පොහොර භාවිතය පිළිබඳ දැනුවත් කිරීම, වාර්මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ද කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය වැඩි කිරීමට හැකි වනු ඇත.

**ජාතික ආර්ථිකය කෙරෙහි කර්මාන්ත අංශයේ දායකත්වය සැලකූ විට, එම අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ද වැඩි ප්‍රමුඛතාවක් දිය යුතුය.** ශ්‍රී ලංකාව ගෝලීයව තරගකාරී බවට පත් කිරීම සඳහා කර්මාන්ත අංශය නව තාක්ෂණය සමඟින් ඉහළ නැංවිය යුතු අතර, අගය එකතු කළ නිෂ්පාදන වෙත යොමු විය යුතුය. පර්යේෂණ සංවර්ධනය හා නව සොයා ගැනීම් සහ විශේෂයෙන්ම, යන්ත්‍රසූත්‍රවල ඵලදායී නොවන කාලය තුරන් කිරීම සඳහා අඛණ්ඩ බලශක්ති සැපයුමක් ලබා දීම, සේවකයන්ගේ නිෂ්ඵල කාලය අවම කිරීම සඳහා විශ්වාසදායක ප්‍රවාහන පහසුකම් සැපයීම වැනි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සම්බන්ධයෙන් කාර්මික සාමය පවත්වා ගැනීම ද වැදගත් වේ. ශ්‍රී ලංකාව නාවික, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම සඳහා ප්‍රධාන ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ සැලසුමක් ඇති බැවින් ඉතා කඩිනමින් සේවා අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මේ සඳහා, ඉතාමත් ප්‍රාථමික මට්ටමේ දී සිසුන් තොරතුරු තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ කිරීම සඳහා සහ පාසල හැරයන අවස්ථාව වනවිට භාෂා හා අනෙකුත් කුසලතාවයන් මෙන්ම ගණකාධිකරණය වැනි අංශයන්හි නිපුණතාවයන් ඇති කිරීම සඳහා පාසල් ක්‍රියාකාරකම් සංශෝධනය කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා ගුරුභවතුන්ගේ කුසලතා වර්ධනය අත්‍යවශ්‍ය වේ. තොරතුරු තාක්ෂණය පිළිබඳ පෞද්ගලික පුහුණු කිරීම්වල තත්ත්වය අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූල බවට සාක්ෂාත් කර ගැනීම සඳහා සහතික කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. එමෙන්ම, පුහුණු ශ්‍රම බලකායේ හිඟය හේතු කොට ගෙන ඉහළ වටිනාකමකින් යුතු ව්‍යාපාර ක්‍රියාවලි බැහැර පැවරීම්හි (Business Process Outsourcing) කාර්යයන් අප වෙත ලබා ගැනීම සීමා විය හැකි බැවින් පාසල් හැර යන්නන් විසින් තොරතුරු තාක්ෂණය සම්බන්ධ ජාත්‍යන්තර මට්ටමේ සුදුසුකම් ලබා ගැනීම සඳහා දිරිගැන්විය යුතුය. ඉතා ඉක්මණින් ප්‍රසාරණය වෙමින් පවතින සංචාරක අංශයේ සියලුම පාර්ශ්වයන්හි හැකියා වර්ධනය කෙරෙහි ද ඇඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා සත්කාරක කර්මාන්තය වෙනුවෙන් විශාල පරිමාණයේ පුහුණු පහසුකම් සැලසිය යුතු වේ. මෙම ක්‍රියාමාර්ගයන් ආර්ථිකයේ ප්‍රධාන අංශයන්හි ඵලදායිතාවය වැඩිදියුණු කිරීමටත් එමගින් තුලිත ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහාත් දායක වේ යැයි අපේක්ෂා කෙරේ.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

**සේවා ස්ථානයන්හි පාර්ශ්වයන් අතර වඩාත් යහපත් සබඳතා සහ සංවාදයන් පවත්වා ගැනීම කාර්මික සාමය වැඩිදියුණු කිරීම සඳහා වැදගත් වේ.** 2010 වසරේ වැඩවර්ජන සඛ්‍යාව 2009 වසරේ වාර්තා වූ සංඛ්‍යාව ඉක්ම වුව ද එය වසර 2000 න් පසු දෙවැනි අඩුතම වර්ජන සංඛ්‍යාවක් වාර්තා කළ වර්ෂය වේ. වැවිලි අංශයෙහි පැවති වැඩවර්ජන සංඛ්‍යාව ඉහළ යෑම හේතුවෙන් 2010 දී පෞද්ගලික අංශයෙහි වැඩවර්ජන 15 ක් වාර්තා විය. 2009 වර්ෂයේ දී 7,665 ක අහිමි වූ මිනිස් දින ගණන සමඟ සැසඳීමේ දී 2010 දී එම දින ගණන 25,071 දක්වා වැඩි විය. 2010 දී වැවිලි අංශයෙහි කාර්මික අරගල ඉහළ යෑම, 2010 වසරෙහි වැඩවර්ජන සංඛ්‍යාව වැඩි වීමට ප්‍රධාන හේතුව විය. වැවිලි අංශයෙහි වැඩවර්ජන සඳහා සහභාගි වූ කම්කරුවන්ගේ සංඛ්‍යාව මෙන්ම එමගින් අහිමි වූ මිනිස් දින ගණන යන දෙකෙහිම ඉහළ යෑමක් සිදු විය. ඒ අනුව, වැවිලි අංශයෙහි වැඩවර්ජන සඳහා සහභාගි වූ කම්කරුවන් සංඛ්‍යාව 2009 හි වූ 300 සමඟ සසඳන විට 2010 දී 3,185 දක්වා ඉහළ නැගුණු අතර අහිමි වූ මිනිස් දින ගණන 2009 හි වූ 300 සමඟ සසඳන විට 2010 දී 23,037 දක්වා ඉහළ නැගිණි. මිනිස් දින 14,220 ක් අහිමි වීමට මුල් වූ කම්කරුවන් 804 ක් සම්බන්ධ වූ වැඩවර්ජන 3 ක් වාර්තා කළ පළමු කාර්තුව තුළ ප්‍රධාන වශයෙන්

**4.16 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ(අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2007 | 8 | 1,468 | 6,089 | 17 | 6,079 | 36,109 | 25 | 7,547 | 42,198 |
| 2008 | 34 | 34,014 | 41,525 | 17 | 3,917 | 24,130 | 51 | 37,931 | 65,655 |
| **2009** | **2** | **300** | **300** | **6** | **4,720** | **7,365** | **8** | **5,020** | **7,665** |
| පළමු කාර්තුව | 2 | 300 | 300 | 3 | 3,095 | 6,190 | 5 | 3,395 | 6,490 |
| දෙවන කාර්තුව | - | - | - | 3 | 1,625 | 1,175 | 3 | 1,625 | 1,175 |
| තෙවන කාර්තුව | - | - | - | - | - | - | - | - | - |
| සිව්වන කාර්තුව | - | - | - | - | - | - | - | - | - |
| **2010 (ආ)** | **9** | **3,185** | **23,037** | **6** | **1,923** | **2,034** | **15** | **5,108** | **25,071** |
| පළමු කාර්තුව | 3 | 804 | 14,220 | 3 | 369 | 408 | 6 | 1,173 | 14,628 |
| දෙවන කාර්තුව | 2 | 449 | 6,009 | 1 | 218 | 218 | 3 | 667 | 6,227 |
| තෙවන කාර්තුව | 2 | 332 | 1,208 | 2 | 1,336 | 1,408 | 4 | 1,668 | 2,616 |
| සිව්වන කාර්තුව | 2 | 1,600 | 1,600 | - | - | - | 2 | 1,600 | 1,600 |

(අ) අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඇතුළත්ය
(ආ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

මෙම ඉහළ යෑම් දක්නට ලැබිණි. අනෙකුත් පෞද්ගලික අංශයේ වැඩවර්ජන සංඛ්‍යාව පෙර වර්ෂයේ පරිදිම 6 ක් විය. කෙසේ වුව ද, 2010 දී අනෙකුත් පෞද්ගලික අංශයේ වැඩවර්ජන සඳහා සම්බන්ධ වූ කම්කරුවන් සංඛ්‍යාව සහ අහිමි වූ මිනිස් දින ගණන සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, වැඩවර්ජන සඳහා සහභාගි වූ සංඛ්‍යාව 2009 හි පැවති 4,720 හි සිට 2010 දී 1,923 දක්වා අඩු වූ අතර, අහිමි වූ මිනිස් දින ගණන 7,365 හි සිට 2,034 දක්වා අඩු විය. අනෙකුත් පෞද්ගලික අංශයෙහි මෙම සතුටුදායක වර්ධනය ප්‍රශංසනීය වේ. වැඩකිරීම සඳහා යහපත් පරිසරයක් අඛණ්ඩව පවත්වා ගැනීම කාර්මික සාමය පවත්වා ගැනීමටත් එමගින් රට තුළ ආයෝජන සහ ඵලදායිතාවය වර්ධනය කිරීමටත් අත්‍යවශ්‍ය වේ.